| මහනුවර | කුණ්ඩසාලේ | පාතදුම්බර උඩගම්පහ නැගෙනහිර කොට්ඨාසයේ උප්පැන්න මරණ හා පාතදුම්බර කොට්ඨාසයේ විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධූරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මහනුවර. |

12-517

---

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

උප්පැන්න, මරණ හා විවාහ/අතිරේක විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් තනතුරු — කුරුණෑගල දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැළකිල්ල ලබන අය විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම ඉල්ලුම් කළ හැකි ය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 40ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 62ට නොවැඩි විය යුතු ය.

04. විවාහ රෙජිස්ට්‍රාර් ධූරයක් සඳහා ඉල්ලුම්කරන්නන් විවාහක අයවිය යුතු අතර විවාහ වී වසර 05කට නොඅඩු විය යුතුය. වැන්දඹු හෝ දික්කසාද නොවිය යුතුය.

05. අයදුම්පත් කැඳවනු ලබන උප්පැන්න, මරණ හා විවාහ/ අතිරේක විවාහ කොට්ඨාසයට ඇතුළත් වන මේ ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම්, අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර පහත උපලේඛනයේ සඳහන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හෝ අදළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, සමෘද්ධි සංවර්ධන සමිති කාර්යාල හා තැපැල් කාර්යාල ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් හා ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම් ඇතුළත් ''ඇමුණුම I'' අදළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් හෝ අදළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2019 ජනවාරි මස 21 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

එන්. සී. විතානගේ,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2018 දෙසැම්බර් මස 06 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

උපලේඛනය

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර | ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය |
|---|---|---|---|
| කුරුණෑගල | මල්ලවපිටිය | මහගල්බඩ මෙගොඩ දකුණු කෝරළය කොට්ඨාසයේ උප්පැන්න, මරණ හා වැඋඩවිල්ලි හත්පත්තුව කොට්ඨාසයේ විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධූරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කුරුණෑගල. |
| කුරුණෑගල | කොටවෙහෙර | මාගුල් මැදගන්දහය නැගෙනහිර කෝරළය කොට්ඨාසයේ උප්පැන්න, මරණ හා වන්නි හත්පත්තුව කොට්ඨාසයේ විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධූරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කුරුණෑගල. |

12-644

**රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව**

**රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණ ඛණ්ඩ 03 සේවා ගණයට අයත් ඕෆ්සෙට් ලිතෝ මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරු තනතුර සඳහා බඳවා ගැනීම (විවෘත බඳවා ගැනීම)**

ආරක්ෂක අමාත්‍යාංශයට අයත් රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ පුරප්පාඩුව පවතින කළමනාකරණ සහකාර තාක්ෂණ ඛණ්ඩ 03 සේවා ගණයට අයත් මුද්‍රණ සේවයේ III පන්තියේ III ශ්‍රේණියේ ඕෆ්සෙට් ලිතෝ මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරු තනතුරු 31 ක් සඳහා සුදුස්සන් තෝරා ගැනීමට අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම නිවේදනය අවසානයේ ඇති ආදර්ශ ආකෘති පත්‍රය අනුව පිළියෙල කරන ලද අයදුම්පත් 2019.01.21 වැනි දිනට හෝ ඊට පෙර ''රජයේ මුද්‍රණාලායාධිපති, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, අංක 118, දෙස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 08'' යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. කවරයේ වම්පස ඉහළ කෙළවරේ ''ඕෆ්සෙට් ලිතෝ මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරු තනතුරට බඳවා ගැනීම (විවෘත බඳවා ගැනීම)'' යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතුය.

01. *තනතුරට බඳවා ගැනීමේ ක්‍රමය :*

බඳවාගනු ලබන තනතුරට අදාළව හය (06) මාසික වෘත්තීය පුහුණුවක් ලබා දී එම පුහුණුව සාර්ථකව නිම කරන නිලධාරීන් අදාළ තනතුරේ බඳවා ගත් දිනය පදනම් කරගෙන ස්ථිර තනතුරට පත් කරනු ලැබේ. ජාතික වෘත්තීය සුදුසුකම් 4 වන (N.V. Q 4) මට්ටමේ කුසලතාවය මැන බැලීම සඳහා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් පවත්වනු ලබන අතර එහිදී දක්වන කුසලතා අනුපිළිවෙල මත සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණයකින් පසු පුරප්පාඩු තනතුරු සඳහා බඳවා ගනු ලැබේ. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී ඕෆ්සෙට් ලිතෝකරණය පිළිබඳ සෑම ක්ෂේත්‍රයෙන්ම ආවරණය වන පරිදි අයදුම්කරුවන්ගේ පරිචය මැන බලන අතර ලබා දෙනු ලබන මුළු ලකුණු ප්‍රමාණය 100 ක් වේ.

02. *සේවා නියුක්ත කරවීමේ කොන්දේසි :*

මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය. (විශ්‍රාම වැටුප් හිමිකම පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට ඔබ යටත් විය යුතුය.)

03. *තනතුරට අදළ වැටුප් ක්‍රමය හා වැටුප් කේත අංකය :*

මසකට රු. 29,840 - 10 x 300 - 11 x 350 - 10 x 560 - 10 x 660 - 48,890 ක වැටුප් පරිමාණයක් මෙම තනතුරට හිමිවේ. (රා. ප. ච. අංක. 03/2016 අනුව)
වැටුප් කේත අංකය - MT1- 2016

04. *බඳවා ගැනීමේ සුදුසුකම් :*

4.1 *වෘත්තීය සුදුසුකම් :*

ඕෆ්සෙට් ලිතෝකරණය පිළිබඳ ජාතික වෘත්තීය සුදුසුකම් හතර (NVQ 4) මට්ටමේ ප්‍රවීණතා සහතිකයන් ලබා තිබීම.

4.2 *පළපුරුද්ද :*

පිළිගත් ආයතනයක අදළ ක්ෂේත්‍රයේ වසර පහ (05) කට නොඅඩු පළපුරුද්දක් තිබීම. (මෙම පළපුරුද්ද විධිමත් ලේඛන මගින් සනාථ කල යුතුය. මෙම පස් අවුරුදු සේවා කාලය තුළ අයදුම්කරුවන් සේවය සඳහා අර්ථසාධක අරමුදලට/විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවා තිබෙන බවට සනාථ කළ යුතුය.)

4.3 *කායික සුදුසුකම් :*

සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

4.4 *වෙනත් සුදුසුකම් :*

4.4.1 අයදුම්කරුවන් ශ්‍රී ලංකා පුරවැසියන් විය යුතුය.

4.4.2 අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

4.4.3 යම් ආගමික නිකායක පැවිදිවරයෙකු නොවිය යුතුය.

4.4.4 රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීතීන්හි V වෙනි පරිච්ඡේදය අනුව රජයේ සේවයට පත්කරනු ලැබීමට නුසුදුසු තැනැත්තෙකු නොවිය යුතුය.

4.4.5. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

4.4.6 සේවා අවශ්‍යතාවය මත දිවා රාත්‍රී ඕනෑම සේවා මුරයක සේවය කළයුතු අතර, පවතින රාජකාරි අනුව වසරේ සෑම දිනකම නොපිරිහෙලා තම සේවය සැපයීමට එකඟ විය යුතුය.

4.5 *වයස් සීමාව :*

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 30 ට නොඅඩු හා උපරිම වයස අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

05. අයදුම්පත් කැඳවනු ලබන දිනට පසුව ලැබෙන හෝ තැපෑලේදී අස්ථානගත වන අයදුම්පත් පිළිබඳ කිසිදු වගකීමක් භාරගනු නොලැබේ.

06. මෙහි සඳහන් නොවන වෙනත් කරුණක් වෙතොත් රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණ සේවා ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව තීරණය වේ.

07. මෙම ගැසට් නිවේදනයේ සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් හෝ පරස්පරතාවක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු වන්නේය.

08. අපේක්ෂකයෙකු කිසියම් කරුණක් සාවද්‍ය බව දන දනම ඉදිරිපත් කර ඇති බව හෙළි වුවහොත්, එසේ නැත්නම් යම් වැදගත් කරුණක් ඔහු/ඇය ඕනෑකමින් යටපත් කර ඇති බව පෙනී ගියහොත් ඔහු/ඇය සේවයෙන් පහකිරිමට යටත් වනු ඇත.

ගංගානි ලියනගේ,
රජයේ මුද්‍රණාලායාධිපති,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,

2018 දෙසැම්බර් මස 21 වැනි දින.

**රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණ සේවා ගණයට අයත් මුද්‍රණ සේවයේ III පන්තියේ III ශ්‍රේණියේ ඕෆ්සෙට් ලිතෝ මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරු තනතුරට විවෘත පදනම යටතේ බඳවා ගැනීම සඳහා අයදුම්පත්‍රය**

1. සම්පූර්ණ නම :————————.
2. මුලකුරු සමග නම :————————.
   * සිංහලෙන්
   * ඉංග්‍රීසියෙන්
3. ලිපිනය :————————.
4. උපන් දිනය :————————.
5. 2019.01.21 දිනට වයස :————————.

   අවු : ☐☐☐☐ මාස ☐☐ දින ☐☐

6. ස්ත්‍රී/පුරුෂ භාවය :————————.
7. විවාහක/අවිවාහක බව :————————.
8. ජාතික හැඳුනුම්පත් අංකය :————————.
9. දුරකථන අංකය : ජංගම :————————. නිවස :————————.
10. ශ්‍රී ලංකා පුරවැසියෙක්ද යන බව :————————.
11. අධ්‍යාපන සුදුසුකම්

* අ.පො.ස. (සාමාන්‍ය පෙළ) -

වර්ෂය :———————— විභාග අංකය :————————

| විෂයය | සාමාර්ථය | විෂයය | සාමාර්ථය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

* අ.පො.ස. (උසස් පෙළ) -

වර්ෂය :————————. විභාග අංකය :————————.

| විෂයය | සාමාර්ථය |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |

12. වෘත්තීය සුදුසුකම් :

i. ඕෆ්සෙට් මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරු තනතුරට අදාලව සහතිකය ලබා තිබේද?
.... (සහතික කරන ලද පිටපතක් ඇමිණිය යුතුය.) :————————.
ii එසේ ලබා තිබේනම් ඒ කුමන මට්ටමද? :————————.
iii. වෙනත් වෘත්තීය සුදුසුකම් :————————.

13. සේවා පළපුරුද්ද :————————.

* පිළිගත් ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ වසර පහ (05) කට නොඅඩු සේවා පළපුරුද්ද සනාථ කෙරෙන සහතිකපත් අමුණා ඇත/නැත.

ඉහත දක්වා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බව මෙයින් සහතික කරමි. තව ද මෙහි දැක්වෙන යම් කරුණක් අසත්‍ය බව සනාථ වුවහොත් මා මෙම තනතුර සඳහා සුදුස්සන් නොවන බව ද මෙයින් ප්‍රකාශ කර සිටිමි.

————————.
අයදුම්කරුගේ අත්සන.

දිනය :————————.

14. දැනටමත් රජයේ සේවයේ නියුක්ත අයදුම්කරුවන් පමණක් තම දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ පහත සඳහන් සහතිකය සමඟ ඉදිරිපත් කළ යුතුය.

ඉහත 1සිට 13 දක්වා වූ තොරතුරු නිවැරදි බවත්, මෙම නිලධාරියා/නිලධාරිණිය අදාළ නිවේදනය ප්‍රකාරව සුදුසුකම් ලබා ඇති බවත් සහතික කරමි. තවද, මෙම නිලධාරියා/නිලධාරිණිය මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් දැනට දරන තනතුරෙන් ඔහු/ඇය මුදාහැරිය හැකි/නොහැකි බවත් දන්වමි.

————————.
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන හා පදවි නාමය.

දිනය :————————.

15. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

අයදුම්කරුවන් තම අත්සන රජයේ පාසැල් ප්‍රධානියෙකු/විශ්‍රාමික ප්‍රධානියෙකු, කොට්ඨාසයේ ග්‍රාම නිලධාරිවරයෙකු, සාම දන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරීලත් නිලධාරියෙකු, රු. 498,960 ක් හෝ ඊට වැඩි වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ හෝ පළාත් පාලන සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික සේවයේ නිලධාරියෙකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර පක්ෂයේ සැලකිය යුතු තත්ත්වයක් දරන අයෙක් ලවා සහතික කරවා ගත යුතුය.

————————.
අත්සන හා පදවි නාමය.

දිනය ————————.

ඉහතින් අත්සන් කර ඇති....... මයා/මිය/මා හොඳින් හඳුනන බවත්, ඔහු/ඇය මා ඉදිරිපිට දී අත්සන යෙදූ බවත් මෙයින් සහතික කරමි.

දිනය :————————.
නම :————————.
නිල නාමය :————————.
ලිපිනය :————————.

12-925

---

# විභාග, විභාග, ප්‍රතිඵල ආදිය

**නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය**

කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව

**තාක්ෂණ/කාර්මික විද්‍යාලයන්හි පැවැත්වෙන ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම 5 සහ 6 (NVQ Level 5/6) ඩිප්ලෝමා මට්ටමේ පාඨමාලා සඳහා සිසුන් ඇතුලත් කර ගැනීම- 2019**

මෙම නිවේදනයේ සඳහන් තාක්ෂණ/කාර්මික විද්‍යාලයන්හි පැවැත්වෙන පාඨමාලා සඳහා සුදුසුකම් ඇති අපේක්ෂකයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්කරුවන් අතුරින් ඔවුන්ගේ සුදුසුකම් හා කුසලතාවයන් සැලකිල්ලට ගෙන පාඨමාලා සඳහා අවශ්‍ය ප්‍රමාණයට සිසුන් බඳවා ගනු ලැබේ.

02. දැන්වීමේ දක්වා ඇති "ආදර්ශ අයදුම්පත්‍රය" ට අනුව A4 ප්‍රමාණයේ කඩදාසියක අදල අයදුම්පත් අයදුම්කරුවන් විසින්ම සකස් කර ගත යුතු වේ. <u>නිසිලෙස සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2019.01.18 වැනි දිනට හෝ ඊට පෙර අදළ තාක්ෂණ/කාර්මික විද්‍යාලයේ අධ්‍යක්ෂ/විදුහල්පති වෙත ලැබෙන සේ ලියපදිංචි තැපෑලෙන් එවිය යුතුය.</u>

එමෙන්ම, මේ පිළිබඳ සියලු තොරතුරු <u>www.dtet.gov.lk</u> වෙබ් අඩවියේ පළකර ඇති අතර අයදුම්පත්‍ර එම වෙබ් අඩවිය මගින් ද ඉදිරිපත් කළ හැක.

03. කවරයෙහි වම්පස ඉහළ කෙලවරෙහි ඉල්ලුම් කරන පාඨමාලාවේ නම හා සංකේත අංකය යොදන්න.

04. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

05. අර්ධකාල/සන්ධ්‍යා කාල පාඨමාලා සඳහා අධ්‍යයන වර්ෂයකට රු. 5,000 ක් අයකරනු ලැබේ.

06. *පාඨමාලාවල ස්වභාවය* :- ඒ ඒ පාඨමාලා සඳහා සුදුසුකම් හා පැවැත්වෙන තාක්ෂණ/කාර්මික විද්‍යාල යනාදිය මෙම දැන්වීමේ දක්වා ඇති පාඨමාලා පිළිබඳ ලේඛණයෙහි සඳහන් කර ඇති අතර, සියළුම අයදුම්කරුවන්ගේ අවධානය එයට යොමු කරවනු ලැබේ. ඒ ඒ තාක්ෂණ/කාර්මික විද්‍යාලයේ ලිපිනය තාක්ෂණ/කාර්මික විද්‍යාල ලැයිස්තුවේ සඳහන් වේ.

07. මෙම තාක්ෂණ/කාර්මික විද්‍යාලයන්හි පාඨමාලා හැදෑරීමට ඉල්ලුම් කරන සෑම ඉල්ලුම්කරුවකුම / ඉල්ලුම්කාරියකම -
(i) මනා චරිතයකින් යුක්ත විය යුතු ය.
(ii) ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතු ය.
(iii) ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කරන අවස්ථාවේ දී ඇතුළත්වීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා තිබිය යුතු ය.

08. <u>සුදුස්සන් තෝරාගනු ලබන්නේ සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මතය. එසේ තේරීමේදී ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ 3/4) ලබා ඇති අපේක්ෂකයින් සඳහා ප්‍රමුඛතාවය ලබාදේ.</u>

09. ලිපි ලේඛන කිසිවක් හෝ ඒවායේ පිටපත් හෝ අයදුම්පත සමග ඉදිරිපත් නොකළ යුතු ය. සම්මුඛ පරීක්ෂණයේ දී අවශ්‍යතා හා පිළිගත හැකි ලිපිලේඛන ඉදිරිපත්නොකර, යෝග්‍යතාව ඔප්පු කිරීමට නොහැකිවන අයදුම්කරුවන් නුසුදුස්සන් වනු ඇත.

10. (i) පූර්ණ කාලීන දිවා පාඨමාලා හදාරණ සිසුන් සඳහා තම පවුලේ ආර්ථික තත්ත්වය මත විද්‍යාලයේ පන්තිවලට සහභාගී වන සෑම දිනකටම රු. 50 දීමනාවක්, (මසකට රු. 1,000 ක උපරිමයකට යටත්ව) ගෙවනු ලැබේ.
(ii) පූර්ණ කාලීන දිවා පාඨමාලා හදාරන සිසුන් අතරින් තෝරාගත් අඩු ආදායම්ලාභී ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා රු. 2500 බැගින් වූ වාර්ෂික ශිෂ්‍යධාරයක් ගෙවනු ලැබේ.
(iii) පූර්ණ කාලීන දිවා පාඨමාලා හදාරන සිසුන් සඳහා ලංගම හා දුම්රිය අනුග්‍රහ වාර ප්‍රවේශ පත්‍ර අවශ්‍යතාව මත ලබාගත හැකිය.

11. අර්ධ කාලීන/සති අන්ත පාඨමාලා සඳහා ලියාපදිංචි වන සිසුන් අදාළ ක්ෂේත්‍රයේ රැකියාවක නියුතු වී සිටිය යුතුය.

12. සිය ලිපි ලේඛණවල සත්‍යතාවය පිළිබඳව ඉල්ලුම්කරු සම්පූර්ණයෙන් ම වගකිව යුතුය. වංචනික හෝ වෙනස් කිරීම සහිත ලිපිලේඛන ඉදිරිපත් කරන හෝ අයදුම්පතෙහි සඳහන් කරුණු සනාථ වන සේ ලිපිලේඛණ සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් නොකරන අයදුම් කරුවන්ගේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

13. මෙම *ගැසට් පත්‍රයෙහි* සඳහන් තාක්ෂණ/කාර්මික විද්‍යාලවල 2019 අධ්‍යයන වර්ෂයෙහි පැවැත්වීමට නියමිත පාඨමාලා සඳහා කිසියම් හේතුවක් නිසා ප්‍රමාණවත් අයදුම්පත්‍ර නොමැති අවස්ථාවක දී එම පාඨමාලා ආරම්භ කිරීම හෝ අත්හිටුවීම කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අභිමතය පරිදි වේ.

14. ඕනෑම අයදුම්කරුවකුට තමන් කැමති ඕනෑම පාඨමාලාවකට වෙන වෙනම ඉල්ලුම්පත්‍රයක් බැගින් ඉදිරිපත් කළ හැකිය.

පී. එන්. කේ. මලලසේකර,
අධ්‍යක්ෂ ජනරාල්,
කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව.

තැ.පෙ. 557,
ඕල්කොට් මාවත,
කොළඹ 10.
www.dtet.gov.lk

*තාක්ෂණ / කාර්මික විද්‍යාල ලැයිස්තුව*

| *අනු අංකය* | *තාක්ෂණ/කාර්මික විද්‍යාලය* | *ලිපිනය* | *දිස්ත්‍රික්කය* | *විද්‍යුත් ලිපිනය/දුරකථන අංකය* |
|---|---|---|---|---|
| 01 | ශ්‍රී ලංකා තාක්ෂණ විද්‍යාලය, මරදාන. | ඕල්කොට් මාවත, කොළඹ 10. | කොළඹ | cotmaradana@gmail.com 0112324177 |
| 02 | ගාල්ල තාක්ෂණ විද්‍යාලය | කළුවැල්ල, ගාල්ල. | ගාල්ල | cotgalle2007@gmail.com 0912234051 |
| 03 | මහනුවර තාක්ෂණ විද්‍යාලය | අරුප්පල , මහනුවර. | මහනුවර | kandycot@gmail.com 0812224063 |
| 04 | යාපනය තාක්ෂණ විද්‍යාලය | බ්‍රවුන්ස් පාර, යාපනය. | යාපනය | cotjaffna@gmail.com 021-2222358 |
| 05 | බදුල්ල තාක්ෂණ විද්‍යාලය | ග්‍රීන්ලේන් ඩ්‍රයිව්, බදුල්ල. | බදුල්ල | cotbadulla@gmail.com 0552222413 |
| 06 | අනුරාධපුර තාක්ෂණ විද්‍යාලය | නව නගරය, අනුරාධපුර. | අනුරාධපුර | cotanuradhapura@gmail.com 0252222666 |
| 07 | කුරුණෑගල තාක්ෂණ විද්‍යාලය | පුත්තලම් පාර, කුරුණෑගල. | කුරුණෑගල | cotkurunegala@gmail.com 0372223264 |
| 08 | අම්පාර හාඩි තාක්ෂණ විද්‍යාලය | ඉඟිනියාගල පාර, අම්පාර | අම්පාර | cotampara@gmail.com 0632223485 |
| 09 | රත්නපුර තාක්ෂණ විද්‍යාලය | ෆාර්ම් ගාර්ඩින්, කොළඹ පාර, රත්නපුර | රත්නපුර | cotrathnapura@gmail.com 0452232390 |
| 10 | මාතර කාර්මික විද්‍යාලය | මැද්දවත්ත, මාතර | මාතර | tcmatara@gmail.com 041-2222565 |
| 11 | කෑගල්ල කාර්මික විද්‍යාලය | කච්චේරි පාර, කෑගල්ල | කෑගල්ල | tckegalle@gmail.com 0352222441 |
| 12 | මඩකලපුව කාර්මික විද්‍යාලය | මන්වන්තුඩුවෙයි, මඩකලපුව | මඩකලපුව | tcbatticaloa@gmail.com 0652246557 |
| 13 | ගම්පහ කාර්මික විද්‍යාලය | වැරැල්ල වත්ත, යක්කල | ගම්පහ | tcgampaha@gmail.com 0332222132 |
| 14 | දඹුල්ල කාර්මික විද්‍යාලය | මාතලේ පාර, දඹුල්ල | මාතලේ | tcdambulla@gmail.com 0662284713/0662284885 |
| 15 | බලපිටිය කාර්මික විද්‍යාලය | දුම්රිය පොළ පාර, වඳුරුව, බලපිටිය | ගාල්ල | tcbalapitiya@gmail.com 0912258096 |
| 16 | මාතලේ කාර්මික විද්‍යාලය | එම්.සී.පාර, මාතලේ. | මාතලේ | tcmatale@gmail.com 0662224196 |
| 17 | කළුතර කාර්මික විද්‍යාලය | කලමුල්ල, කළුතර | කළුතර | teckalutara@gmail.com 0342222325 |
| 18 | රත්මලාන කාර්මික විද්‍යාලය | ගාලුපාර, රත්මලාන | කොළඹ | tcratmalana@gmail.com 0112633479 |
| 19 | බෙලිඅත්ත කාර්මික විද්‍යාලය | පුවක්දණ්ඩාව, බෙලිඅත්ත | හම්බන්තොට | tcbeliatta@gmail.com 0472243229 |
| 20 | බණ්ඩාරවෙල කාර්මික විද්‍යාලය | වැවතන්න, බණ්ඩාරවෙල | බදුල්ල | tcbandarawela@gmail.com 0572222754/0572233753 |
| 21 | සමන්තුරේ කාර්මික විද්‍යාලය | අම්පාර පාර, සමන්තුරේ | අම්පාර | tcsammanthurai@gmail.com 0632223485/0632224236 |
| 22 | කුලියාපිටිය කාර්මික විද්‍යාලය | පන්නල පාර, කුලියාපිටිය | කුරුණෑගල | tckuliyapitiya@gmail.com 0372281181 |
| 23 | හෝමාගම කාර්මික විද්‍යාලය | ගොඩගම, හෝමාගම. | කොළඹ | tchomagama@gmail.com 011-2855315 |
| 24 | වවුනියාව කාර්මික විද්‍යාලය | මන්නාරම පාර, වවුනියාව | වවුනියාව | tevavuniya@gmail.com 024-2223664/024-2226720 |
| 25 | අක්කරෙයිපත්තුව කාර්මික විද්‍යාලය | ප්‍රධාන වීදිය, අක්කරෙයිපත්තුව | අම්පාර | tcakkaraipattu 2005@gmail.com 067-2279326/067-2279602 |

ආදර්ශ අයදුම්පත්‍රය

**තාක්ෂණ විද්‍යාල/කාර්මික විද්‍යාලයන්ට ඇතුළත්වීම සඳහා අයදුම්පත්‍රය - 2019 අධ්‍යයන වර්ෂය**

| |
|---|
| කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා |

1. ඉල්ලුම් කරන පාඨමාලාවේ නම සහ සංකේත අංකය :

1. ............................................................

2. ජාතික හැඳුනුම්පත් අංකය :

3. භාෂා මාධ්‍යය : සිංහල | දෙමළ | ඉංග්‍රීසි

4. අයදුම්කරුගේ මුලකුරු සමග නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :

5. සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :

6. මුලකුරු සමග නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

7. ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.

8. ස්ථිර ලිපිනය (සිංහලෙන්) :————.

9. උපන් දිනය : 2019.01.01 දිනට වයස : අවුරුදු මාස දින

10. ස්ත්‍රී/පුරුෂ භාවය :————.

11. පළාත : දිස්ත්‍රික්කය :
ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය : ග්‍රාම නිලධාරි කොට්ඨාසය : .

12. දුරකථන අංකය : නිවස :
ජංගම :

13. NVQ සුදුසුකම් යටතේ ඇතුලත්වීමට අපේක්ෂා කරන අයදුම්කරුවන් සඳහා :

| ලබා ඇති සහතිකයේ නම (වෘත්තීය ක්ෂේත්‍රයද සමග) | NVQ මට්ටම | පාඨමාලාව හැදෑරූ ආයතනයේ නම | අදාල සේවා පළපුරුද්ද ඇත්නම් ඒ පිළිබඳ විස්තර කෙටියෙන් | සේවා කාලය අවුරුදු/මාස |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |

14. අධ්‍යාපන සුදුසුකම් :
(*අ*) අ. පො. ස. (සා. පෙළ) ප්‍රතිඵල (දෙවරකට නොවැඩි වාර ගණනක දී)

*පළමුවර* : විභාග අංකය :...........................
වර්ෂය :.................. මාධ්‍යය :..................

| | *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|---|
| 1 | | |
| 2 | | |
| 3 | | |
| 4 | | |
| 5 | | |
| 6 | | |
| 7 | | |
| 8 | | |
| 9 | | |
| 10 | | |

*දෙවනවර* : විභාග අංකය :.........................
වර්ෂය :.................. මාධ්‍යය :...............

| | *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|---|
| 1 | | |
| 2 | | |
| 3 | | |
| 4 | | |
| 5 | | |
| 6 | | |
| 7 | | |
| 8 | | |
| 9 | | |
| 10 | | |

(*ආ*) අ. පො. ස. (උ. පෙළ) ප්‍රතිඵල (එක් වරකදී) :

1. විභාග අංකය : ...................................
2. වර්ෂය :.............................................
3. මාධ්‍යය :...........................................

| *වර්ෂය* | *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |

(*ඇ*) ඉහත සඳහන් (අ) සුදුසුකම සපුරා නොමැතිනම් ලබා ඇති ඉහළම අධ්‍යාපන සුදුසුකම් :

ශ්‍රේණිය :————. වර්ෂය :————.

15. සන්ධ්‍යා/අර්ධ කාලීන පාඨමාලා සඳහා පමණක් අදළ වේ.

(රැකියා අවශ්‍යතාවයන් ඉල්ලා ඇති පාඨමාලා සඳහා පමණක් මෙම කොටස සම්පූර්ණ කරන්න.)

15.1 අයදුම්කරුගේ නම :.............................................
15.2 දැනට දරන තනතුර හා ඊට පත්වූ දිනය :.............................................
ස්වයං රැකියාවක නියුක්ත නම් එහි ස්වභාවය :.............................................
15.3 සේවා ස්ථානය හා එහි ලිපිනය :.............................................
.............................................
.............................................

සේවක අර්ථසාධක අරමුදල් අංකය (EPF) :...............සේවක භාරකාර අරමුදල් අංකය (ETF) :............

ඉහත අයදුම්කරු මෙම ආයතනයේ/කාර්යාලයේ සේවය කරන බවට සහතික කරමි.

15.4 සේවා යෝජකයාගේ නම :.............................................
15.5 තනතුර :.............................................
15.6 අත්සන :.............................................

16. අයදුම්කරුගේ ප්‍රකාශය :

මවිසින් අයදුම්පත්‍රයේ සඳහන් කර ඇති තොරතුරු මා දන්නා තරමින් නිවැරදි බවත්, ඉල්ලුම් කොට ඇති පාඨමාලාවට අවශ්‍ය සුදුසුකම් මා සපුරා ඇති බවත්, මෙයින් සහතික කරමි. තවද තාක්ෂණ විද්‍යාලවලට/කාර්මික විද්‍යාලවලට සිසුන් ඇතුළත් කර ගැනීම පිළිබඳ පටිපාටියට එකඟවීමට ද කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අවසාන තීරණය පිළිගැනීමට ද පොරොන්දු වෙමි.

__________,
අයදුම්කරුගේ අත්සන.

දිනය :__________.

**තාක්ෂණ/ කාර්මික විද්‍යාලවල පැවැත්වෙන ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම් - 5/6 (NVQ Level - 5/6)**

**ඩිප්ලෝමා මට්ටමේ පාඨමාලාවන්ට ඇතුළත්වීම සඳහා සුදුසුකම්**

**විදුලි, විද්‍යුත් හා විදුලි සංදේශ ක්ෂේත්‍රය**

*පූර්ණ කාල පාඨමාලා*

| අනු. අංකය | පාඨමාලා සංකේත අංකය | පාඨමාලාවේ නම හා ස්වභාවය | පැවැත්වෙන තාක්ෂණ/ කාර්මික විද්‍යාලය | ඇතුළත්වීමේ සුදුසුකම්<br>පූර්ණ කාලීන පාඨමාලා<br>වයස අවුරුදු 17ත් 29ත් අතර විය යුතුය.<br>අර්ධ කාලීන පාඨමාලා<br>වයස අවුරුදු 17 ට වැඩි විය යුතුය. |
|---|---|---|---|---|
| 01 | ETA 21 | විදුලි සංදේශ තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව<br><br>NVQ 5 සහ 6 මට්ටම් ඒකාබද්ධව පවතී.<br><br>පූර්ණ කාල දිවා අවුරුදු 2 1/2<br>(පදනම් පාඨමාලාවක් ද ඇතුළත්ය)<br><br>(This course Includes the use of Telecommunication Devices to Exchange Information by Electronic and Electrical Means Over a Significant distance) | ඉංග්‍රීසි මාධ්‍යය<br>ගාල්ල<br>යාපනය<br>ගම්පහ | ■ පරිගණක දෘඩාංග ශිල්පී<br>■ කර්මාන්ත විදුලි ශිල්පී<br>■ පරිගණක ජාලකරණ ශිල්පී<br>■ ගුවන් විදුලි යන්ත්‍ර හා රූපවාහිනී අළුත්වැඩියා කාර්මික ශිල්පී<br><br>ඉහත පාඨමාලාවලින් එකක් සඳහා NVQ මට්ටම් 3/4 සහතික ලබා තිබීම;<br>*හෝ*<br>අ.පො.ස.(උ.පෙළ) ඉංජිනේරු තාක්ෂණවේදය /ගණිතය / විද්‍යාව යන විෂයධාරාවන්ගෙන් අවම වශයෙන් විෂයයන් තුනක් සමත් වීම. (උසස් පෙළ ඉංජිනේරු තාක්ෂණවේදය හැදෑරූ සිසුන් කෙරෙහි ප්‍රමුඛතාවය ලබා දෙනු ලැබේ.);<br>*හෝ*<br>කලා විෂය ධාරාවේ දෘඩ තාක්ෂණය (Hard Technology) යටතේ වූ විදුලි තාක්ෂණය (Electrical Technology),විද්‍යුත් තාක්ෂණය (Electronic Technology),තොරතුරු තාක්ෂණය (ICT) යන විෂයයන් අතුරින් එක් විෂයයක් සඳහා සම්මාන සමාර්ථයක් සහිතව විෂයයන් තුනක් සමත්වීම. |
| 02 | ETB 28 | ඉලෙක්ට්‍රොනික් තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව<br><br>NVQ මට්ටම් 5<br><br>පූර්ණ කාල දිවා - අවුරුදු 1 1/2<br>(පදනම් පාඨමාලාවක් ද ඇතුළත්ය) | ඉංග්‍රීසි මාධ්‍යය<br>ගම්පහ | රජය පිළිගත් ඕනෑම වෘත්තීය පුහුණු ආයතනයක ක්ෂේත්‍රයට අදාළව NVQ මට්ටම් 3/4 පාඨමාලාවක් හදාරා සහතික ලබා තිබීම;<br>*හෝ*<br>අ.පො.ස. (උ.පෙළ) ඉංජිනේරු තාක්ෂණවේදය / ගණිත / විද්‍යා යන විෂයධාරාවන්ගෙන් අවම වශයෙන් විෂයයන් තුනක් සමත් වීම. |
| 03 | ETB 31 | විදුලි තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව<br><br>NVQ මට්ටම් 5<br><br>පූර්ණ කාල දිවා - අවුරුදු 1 1/2<br>(පදනම් පාඨමාලාවක් ද ඇතුළත්ය) | ඉංග්‍රීසි මාධ්‍යය<br>ගම්පහ | රජය පිළිගත් ඕනෑම වෘත්තීය පුහුණු ආයතනයක ක්ෂේත්‍රයට අදාළව NVQ මට්ටම් 3/4 පාඨමාලාවක් හදාරා සහතික ලබා තිබීම;<br>*හෝ*<br>අ.පො.ස. (උ.පෙළ) ඉංජිනේරු තාක්ෂණවේදය / ගණිත / විද්‍යා යන විෂයධාරාවන්ගෙන් අවම වශයෙන් විෂයයන් තුනක් සමත් වීම. |
| 04 | ETC 02 | ක ර් ම ා න ් ත තාක්ෂණිකයින් සඳහා වූ ජාතික සහතිකය<br>(විදුලි ඉංජිනේරු)<br><br>(NVQ මට්ටම් 5)<br><br>පූර්ණ කාල දිවා - දෑවුරුදු<br>(පදනම් පාඨමාලාවක් ද ඇතුළත්ය) | ඉංග්‍රීසි මාධ්‍යය<br>මහනුවර<br>රත්මලාන | රජය පිළිගත් ඕනෑම වෘත්තීය පුහුණු ආයතනයක ක්ෂේත්‍රයට අදාළව NVQ මට්ටම් 3/4 පාඨමාලාවක් හදාරා සහතික ලබා තිබීම;<br>*හෝ*<br>අ.පො.ස. (උ.පෙළ) ඉංජිනේරු තාක්ෂණවේදය / ගණිත / විද්‍යා යන විෂයධාරාවන්ගෙන් අවම වශයෙන් විෂයයන් තුනක් සමත් වීම. |

**විදුලි, විද්‍යුත් හා විදුලි සංදේශ ක්ෂේත්‍රය**

*අර්ධ කාල පාඨමාලා*

| අනු. අංකය | පාඨමාලා සංකේත අංකය | පාඨමාලාවේ නම හා ස්වභාවය | පැවැත්වෙන තාක්ෂණ/ කාර්මික විද්‍යාලය | ඇතුළත්වීමේ සුදුසුකම්<br>පූර්ණ කාලීන පාඨමාලා<br>වයස අවුරුදු 17ත් 29ත් අතර විය යුතුය.<br>අර්ධ කාලීන පාඨමාලා<br>වයස අවුරුදු 17 ට වැඩි විය යුතුය. |
|---|---|---|---|---|
| 05 | ETA 21.1 | විදුලි සංදේශ තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව<br><br>NVQ 5 සහ 6 මට්ටම් ඒකාබද්ධව පවතී.<br><br>සති අන්ත/අර්ධ කාල (NVQ Level-5/6 සඳහා නියමිත පැය ගණන)<br><br>(පදනම් පාඨමාලාවක්ද ඇතුළත්ය)<br><br>(This course Includes the use of Telecommunication Devices to Exchange Information by Electronic and Electrical Means Over a Significant distance) | ඉංග්‍රීසි මාධ්‍යය<br>මරදාන | ■ පරිගණක දෘඩාංග ශිල්පී<br>■ කර්මාන්ත විදුලි ශිල්පී<br>■ පරිගණක ජාලකරණ ශිල්පී<br>■ ගුවන් විදුලි යන්ත්‍ර හා රූපවාහිනී අළුත්වැඩියා කාර්මික ශිල්පී<br><br>ඉහත පාඨමාලාවලින් එකක් සඳහා NVQ මට්ටම් 3/4 සහතික ලබා තිබීම; |

**මෙකාට්‍රොනික් ක්ෂේත්‍රය**

*පූර්ණ කාල පාඨමාලා*

| අනු. අංකය | පාඨමාලා සංකේත අංකය | පාඨමාලාවේ නම හා ස්වභාවය | පැවැත්වෙන තාක්ෂණ/ කාර්මික විද්‍යාලය | ඇතුළත්වීමේ සුදුසුකම්<br>පූර්ණ කාලීන පාඨමාලා<br>වයස අවුරුදු 17ත් 29ත් අතර විය යුතුය.<br>අර්ධ කාලීන පාඨමාලා<br>වයස අවුරුදු 17 ට වැඩි විය යුතුය. |
|---|---|---|---|---|
| 06 | ETB 04 | මෙකාට්‍රොනික් තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව<br><br>NVQ මට්ටම් 5<br><br>පූර්ණ කාල දිවා අවුරුදු 1 1/2<br><br>(පදනම් පාඨමාලාවක් ද ඇතුළත්ය.)<br><br>(This course includes the subjects related to Designing, Operating,Maintaining and Repairing Hydraulic, Pneumatic Electrical and Electronic Systems. Also include Robotic PLC, SCADA and Systems) | ඉංග්‍රීසි මාධ්‍යය<br>මරදාන<br>ගාල්ල<br>ගම්පහ | ■ ගුවන් විදුලි යන්ත්‍ර හා රූපවාහිනී යන්ත්‍ර අළුත්වැඩියා කාර්මික ශිල්පී<br>■ පරිගණක දෘඩාංග ශිල්පී<br>■ විදුලි කාර්මික ශිල්පී<br>■ වායු කාර්මික ශිල්පී (Pneumatic Technician).<br>■ මෝටර් රථ කාර්මික ශිල්පී<br>■ මෝටර් රථ විදුලි කාර්මික ශිල්පී<br>■ ගෘහස්ථ විදුලි උපකරණ අළුත්වැඩියා කාර්මික ශිල්පී<br>■ වැද්දුම්කරු /යන්ත්‍ර ශිල්පී<br>ඉහත පාඨමාලාවලින් එකක් සඳහා NVQ මට්ටම් 3/4 සහතික ලබා තිබීම;<br>*හෝ*<br>අ.පො.ස.(උ.පෙළ) ඉංජිනේරු තාක්ෂණවේදය/ ගණිතය / විද්‍යාව යන විෂයධාරාවන්ගෙන් අවම වශයෙන් විෂයයන් තුනක් සමත් වීම. (උසස් පෙළ ඉංජිනේරු තාක්ෂණවේදය හැදෑරූ සිසුන් කෙරෙහි ප්‍රමුඛතාවය ලබාදෙනු ලැබේ.);<br>*හෝ*<br>කලා විෂය ධාරාවේ දෘඩ තාක්ෂණය (Hard Technology) යටතේ වූ විදුලි තාක්ෂණය (Electrical Technology),විද්‍යුත් තාක්ෂණය (Electronic Technology),තොරතුරු තාක්ෂණය (ICT) යන විෂයයන් අතුරින් එක් විෂයයක් සඳහා සම්මාන සමාර්ථයක් සහිතව විෂයයන් තුනක් සමත්වීම. |
| 07 | ETB 29 | වායු හා ද්‍රව පීඩන තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව<br><br>National Diploma in Pneumatics and Hydraulics<br><br>**NVQ** මට්ටම් **5**<br><br>පූර්ණ කාල දිවා අවුරුදු 1 1/2<br><br>(පදනම් පාඨමාලාවක් ද ඇතුළත්ය.) | ඉංග්‍රීසි මාධ්‍යය<br>ගම්පහ | ■ යන්ත්‍ර ශිල්පී<br>■ විදුලි කාර්මික ශිල්පී<br>■ මෝටර් රථ කාර්මික ශිල්පී<br>■ වායු කාර්මික ශිල්පී (Pneumatic Technician).<br><br>ඉහත පාඨමාලාවලින් එකක් සඳහා NVQ මට්ටම් 3/4 සහතික ලබා තිබීම;<br>*හෝ*<br>අ.පො.ස.(උ.පෙළ) ඉංජිනේරු තාක්ෂණවේදය /ගණිතය/විද්‍යාව යන විෂයධාරාවන්ගෙන් අවම වශයෙන් විෂයයන් තුනක් සමත් වීම. (උසස් පෙළ ඉංජිනේරු තාක්ෂණවේදය හැදෑරූ සිසුන් කෙරෙහි ප්‍රමුඛතාවය ලබාදෙනු ලැබේ.); |
| 08 | ETB 30 | CNC තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව<br><br>National Diploma in CNC Technology (Computer Numerical Control)<br><br>NVQ මට්ටම් 5<br><br>පූර්ණ කාල දිවා අවුරුදු 1 1/2<br><br>(පදනම් පාඨමාලාවක්ද ඇතුලත්ය.) | ඉංග්‍රීසි මාධ්‍යය<br>ගම්පහ | ■ යන්ත්‍ර ශිල්පී<br>■ ඇළුමිනියම් පිළිසකර කරන්නා,<br><br>ඉහත පාඨමාලාවලින් එකක් සඳහා NVQ මට්ටම් 3/4 සහතික ලබා තිබීම;<br>*හෝ*<br>අ.පො.ස.(උ.පෙළ) ඉංජිනේරු තාක්ෂණවේදය /ගණිතය/විද්‍යාව යන විෂයධාරාවන්ගෙන් අවම වශයෙන් විෂයයන් තුනක් සමත් වීම. (උසස් පෙළ ඉංජිනේරු තාක්ෂණවේදය හැදෑරූ සිසුන් කෙරෙහි ප්‍රමුඛතාවය ලබාදෙනු ලැබේ.); |

**මෙකාට්‍රොනික් ක්ෂේත්‍රය**

*අර්ධ කාල පාඨමාලා*

| අනු අංකය | පාඨමාලා සංකේත අංකය | පාඨමාලාවේ නම හා ස්වභාවය | පැවැත්වෙන තාක්ෂණ/ කාර්මික විද්‍යාලය | ඇතුළත්වීමේ සුදුසුකම්<br>පූර්ණ කාලීන පාඨමාලා<br>වයස අවුරුදු 17ත් 29ත් අතර විය යුතුය.<br>අර්ධ කාලීන පාඨමාලා<br>වයස අවුරුදු 17 ට වැඩි විය යුතුය. |
|---|---|---|---|---|
| 09 | ETB 04.1 | මෙකාට්‍රොනික් තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව NVQ මට්ටම් 5<br><br>සති අන්ත/අර්ධ කාල (NVQ Level - 5 සඳහා නියමිත පැය ගණන)<br><br>(පදනම් පාඨමාලාවක්ද ඇතුළත්ය.)<br><br>(This course includes the subjects related to Designing, Operating, Maintaining and Repairing Hydraulic, Pneumatic Electrical and Electronic Systems. Also include Robotic PLC, SCADA and Systems) | ඉංග්‍රීසි මාධ්‍ය<br>මරදාන<br>ගාල්ල | ➢ ගුවන් විදුලි යන්ත්‍ර හා රූපවාහිනී යන්ත්‍ර අළුත්වැඩියා කාර්මික ශිල්පී<br>➢ පරිගණක දෘඩාංග ශිල්පී<br>➢ විදුලි කාර්මික ශිල්පී<br>➢ වායු කාර්මික ශිල්පී (Pneumatic Technician)<br>➢ මෝටර් රථ කාර්මික ශිල්පී<br>➢ මෝටර් රථ විදුලි කාර්මික ශිල්පී<br>➢ ගෘහස්ථ විදුලි උපකරණ අළුත්වැඩියා කාර්මික ශිල්පී<br>➢ වැද්දුම්කරු/යන්ත්‍ර ශිල්පී<br><br>ඉහත පාඨමාලාවලින් එකක් සඳහා NVQ මට්ටම් 3/4 සහතික ලබා තිබීම. |

ගොඩනැගිලි ඉදිකිරීම් ක්ෂේත්‍රය

පූර්ණ කාල පාඨමාලා

| අනු. අංකය | පාඨමාලා සංකේත අංකය | පාඨමාලාවේ නම හා ස්වභාවය | පැවැත්වෙන තාක්ෂණ/ කාර්මික විද්‍යාලය | ඇතුලත්වීමේ සුදුසුකම් පූර්ණ කාලීන පාඨමාලා වයස අවුරුදු 17ත් 29ත් අතර විය යුතුය. අර්ධ කාලීන පාඨමාලා වයස අවුරුදු 17 ට වැඩි විය යුතුය. |
|---|---|---|---|---|
| 10 | ETB 06 | ඉදිකිරීම් තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව<br><br>NVQ මට්ටම් 5<br><br>පූර්ණ කාල දිවා අවුරුදු 1 1/2<br><br>(පදනම් පාඨමාලාවක්ද ඇතුළත්ය.)<br><br>(This course includes the subjects related to Planning of Construction Works, Managing and Organizing Sites) | ඉංග්‍රීසි මාධ්‍යය<br>බදුල්ල<br>කුරුණෑගල<br>අනුරාධපුර<br>ගාල්ල<br>රත්නපුර<br>යාපනය | ➢ගොඩනැගිලි ඉදිකිරීම් ශිල්පී (පෙදරේරු)<br>➢ලී වැඩ ශිල්පී(ඉදිකිරීම්)<br>➢ඉදිකිරීම් ක්ෂේත්‍ර පරීක්ෂක<br>➢ජලනල ශිල්පී<br>➢කර්මාන්ත ජලනල ශිල්පී<br>➢ගොඩනැගිලි පින්තාරු ශිල්පී<br>➢සැලසුම් ශිල්පී<br>➢සහකාර ප්‍රමාණ සමීක්ෂක<br><br>ඉහත පාඨමාලාවලින් එකක් සඳහා NVQ මට්ටම් 3/4 සහතික ලබා තිබීම;<br>හෝ<br>අ.පො.ස.(උ.පෙළ) ඉංජිනේරු තාක්ෂණවේදය/ ගණිතය / විද්‍යාව යන විෂයය ධාරාවන්ගෙන් අවම වශයෙන් විෂයයන් තුනක් සමත් වීම. (උසස් පෙළ ඉංජිනේරු තාක්ෂණවේදය හැදෑරූ සිසුන් කෙරෙහි ප්‍රමුඛතාවය ලබා දෙනු ලැබේ.);<br>හෝ<br>කලා විෂය ධාරාවේ දෘඩ තාක්ෂණය (Hard Technology) යටතේ වූ විදුලි තාක්ෂණය (Electrical Technology), විද්‍යුත් තාක්ෂණය (Electronic Technology), සිවිල් තාක්ෂණය (Civil Technology) යන විෂයයන් අතුරින් එක් විෂයයක් සඳහා සම්මාන සාමාර්ථයක් සහිතව විෂයයන් තුනක් සමත්වීම. |
| 11 | ETC 01 | කර්මාන්ත තාක්ෂණිකයින් සඳහා වූ ජාතික සහතිකය (සිවිල් ඉංජිනේරු)<br><br>NVQ මට්ටම් 5<br><br>පූර්ණ කාල දිවා - දෑවුරුදු (පදනම් පාඨමාලාවක්ද ඇතුළත්ය) | ඉංග්‍රීසි මාධ්‍යය<br>මහනුවර<br>රත්මලාන<br>කුලියාපිටිය | රජය පිළිගත් ඕනෑම වෘත්තීය පුහුණු ආයතනයක ක්ෂේත්‍රයට අදාළව NVQ මට්ටම් 3/4 පාඨමාලාවක් හදාරා සහතික ලබා තිබීම;<br>හෝ<br>අ.පො.ස. (උ.පෙළ) ඉංජිනේරු තාක්ෂණවේදය / ගණිතය / විද්‍යාව යන විෂයධාරාවන්ගෙන් අවම වශයෙන් විෂයයන් තුනක් සමත් වීම. |
| 12 | ETB 17 | ප්‍රමාණ සමීක්ෂණ තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව<br><br>**NVQ** මට්ටම් **5**<br><br>පූර්ණ කාල දිවා අවුරුදු 1 1/2<br><br>(පදනම් පාඨමාලාවක් ද ඇතුළත්ය.)<br><br>(This course includes mathematical processes used in estimating cost of a new building construction, improvement, or reproduction.) | ඉංග්‍රීසි මාධ්‍යය<br>අම්පාර<br>අනුරාධපුර<br>බදුල්ල<br>ගාල්ල<br>යාපනය<br>මහනුවර<br>කුරුණෑගල<br>මරදාන<br>රත්නපුර<br>බලපිටිය<br>බෙලිඅත්ත<br>ගම්පහ<br>හෝමාගම<br>කළුතර<br>කෑගල්ල<br>කුලියාපිටිය<br>මාතර<br>මාතලේ<br>මඩකලපුව<br>සම්මන්තුරේ | ➢ ඉංජිනේරු සැලසුම් ශිල්පය පිළිබඳ ජාතික සහතිකය<br>➢ ගොඩනැගිලි ඉදිකිරීම් ශිල්පී (පෙදරේරු)<br>➢ඉදිකිරීම් ක්ෂේත්‍ර පරීක්ෂක<br>➢සහකාර ප්‍රමාණ සමීක්ෂක<br>➢ ජලනල ශිල්පී<br>➢කර්මාන්ත ජලනල ශිල්පී<br>➢ගොඩනැගිලි සේවා තාක්ෂණික ශිල්පී<br><br>ඉහත පාඨමාලාවලින් එකක් සඳහා NVQ මට්ටම් 3/4 සහතික ලබා තිබීම,<br>හෝ<br>අ.පො.ස. (උ.පෙළ) තාක්ෂණවේදය/ ගණිතය/විද්‍යාව යන විෂය ධාරාවන්ගෙන් අවම වශයෙන් විෂයයන් තුනක් සමත් වීම. (උසස් පෙළ තාක්ෂණවේදය හැදෑරූ සිසුන් කෙරෙහි ප්‍රමුඛතාවය ලබා දෙනු ලැබේ.)<br>හෝ<br>කලා විෂයය ධාරාවේ දෘඩ තාක්ෂණය (Hard Technology) යටතේ වූ සිවිල් තාක්ෂණය (Civil Technology) විෂයයට සම්මාන සාමාර්ථයක් සහිතව විෂයයන් තුනක් (03) සමත්වීම. |
| 13 | ETB 20 | ගොඩනැගිලි සේවා තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව<br><br>NVQ මට්ටම් 5<br><br>පූර්ණකාල දිවා අවුරුදු 1 1/2<br><br>(පදනම් පාඨමාලාවක්ද ඇතුළත්ය.) | ඉංග්‍රීසි මාධ්‍යය<br><br>මරදාන | ➢ ගොඩනැගිලි ඉදිකිරීම් ශිල්පී (පෙදරේරු)<br>➢ලී වැඩ ශිල්පී(ඉදිකිරීම්)<br>➢ඉදිකිරීම් ක්ෂේත්‍ර පරීක්ෂක<br>➢ජලනල ශිල්පී<br>➢කර්මාන්ත ජලනල ශිල්පී<br>➢ගොඩනැගිලි පින්තාරු ශිල්පී<br>➢ සැලසුම් ශිල්පී<br>➢සහකාර ප්‍රමාණ සමීක්ෂක<br>➢විදුලි කාර්මික ශිල්පී<br>➢කර්මාන්ත විදුලි ශිල්පී<br>ඉහත පාඨමාලාවලින් එකක් සඳහා NVQ මට්ටම් 3/4 සහතික ලබා තිබීම;<br>හෝ<br>අ.පො.ස.(උ.පෙළ) ඉංජිනේරු තාක්ෂණවේදය/<br>ගණිත / විද්‍යා යන විෂයධාරාවන්ගෙන් අවම වශයෙන් විෂයයන් තුනක් සමත් වීම. (උසස් පෙළ ඉංජිනේරු තාක්ෂණවේදය හැදෑරූ සිසුන් කෙරෙහි ප්‍රමුඛතාවය ලබා දෙනු ලැබේ.)<br>හෝ<br>කලා විෂයය ධාරාවේ දෘඩ තාක්ෂණය (**Hard Technology**) යටතේ වූ සිවිල් තාක්ෂණය (**Civil Technology**) විෂය සඳහා සම්මාන සාමාර්ථයක් සහිතව විෂයයන් තුනක් සමත්වීම. |
| 14 | ETB 27 | සැලසුම් ශිල්පය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව (ගොඩනැගිලි)<br><br>NVQ මට්ටම 5<br><br>පූර්ණකාල දිවා අවුරුදු 1 1/2<br><br>(පදනම් පාඨමාලාවක්ද ඇතුලත්ය.)<br><br>(This course includes basic drawing concepts, drawings using drafting software, construction detail drawings, architectural detail drawings, setting out and leveling) | ඉංග්‍රීසි මාධ්‍යය<br>කුරුණෑගල | අවුරුදු දෙකක පළපුරුද්ද සමග ඉංජිනේරු සැලසුම් ශිල්පය පිළිබඳ සහතිකය NVQ මට්ටම් 3 පාඨමාලාවක් හදාරා සහතික ලබා තිබීම;<br>හෝ<br>සැලසුම් ශිල්පය පිළිබඳ සහතිකය NVQ මට්ටම් 4 පාඨමාලාවක් හදාරා සහතික ලබා තිබීම. |

ගොඩනැගිලි ඉදිකිරීම් ක්ෂේත්‍රය

අර්ධ කාල පාඨමාලා

| අනු අංකය | පාඨමාලා සංකේත අංකය | පාඨමාලාවේ නම හා ස්වභාවය | පැවැත්වෙන තාක්ෂණ/ කාර්මික විද්‍යාලය | ඇතුලත්වීමේ සුදුසුකම් පූර්ණ කාලීන පාඨමාලා වයස අවුරුදු 17ත් 29ත් අතර විය යුතුය. අර්ධ කාලීන පාඨමාලා වයස අවුරුදු 17 ට වැඩි විය යුතුය. |
|---|---|---|---|---|
| 15 | ETB 06.1 | ඉදිකිරීම් තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව<br><br>**NVQ** මට්ටම **5**<br><br>සති අන්ත/අර්ධ කාල (NVQ Level - 5 සඳහා නියමිත පැය ගණන)<br><br>(පදනම් පාඨමාලාවක්ද ඇතුළත්ය.)<br><br>(This course includes the subjects related to Planning of Construction Works, Managing and Organizing Sites) | ඉංග්‍රීසි මාධ්‍යය<br>අම්පාර<br>අනුරාධපුර<br>ගාල්ල<br>යාපනය<br>කුරුණෑගල<br>රත්නපුර | ➢ගොඩනැගිලි ඉදිකිරීම් ශිල්පී (පෙදරේරු)<br>➢ලී වැඩ ශිල්පී (ඉදිකිරීම්)<br>➢ඉදිකිරීම් ක්ෂේත්‍ර පරීක්ෂක<br>➢ජලනල ශිල්පී<br>➢කර්මාන්ත ජලනල ශිල්පී<br>➢ගොඩනැගිලි පින්තාරු ශිල්පී<br>➢සැලසුම් ශිල්පී<br>➢සහකාර ප්‍රමාණ සමීක්ෂක<br><br>ඉහත පාඨමාලාවලින් එකක් සඳහා NVQ මට්ටම් 3/4 සහතික ලබා තිබීම |
| 16 | ETA 06.1 | ඉදිකිරීම් තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව<br><br>**NVQ** මට්ටම **6**<br><br>සති අන්ත/අර්ධ කාල (NVQ Level - 6 සඳහා නියමිත පැය ගණන)<br><br>(පදනම් පාඨමාලාවක්ද ඇතුළත්ය.) | ඉංග්‍රීසි මාධ්‍යය<br>කුරුණෑගල | ඉදිකිරීම් තාක්ෂණය පිළිබඳ NVQ මට්ටම් 5 පාඨමාලාවක් හදාරා සහතික ලබා තිබීම. |
| 17 | ETB 17.1 | ප්‍රමාණ සමීක්ෂණ තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව<br><br>NVQ මට්ටම් 5<br><br>සති අන්ත/අර්ධ කාල (NVQ Level - 5 සඳහා නියමිත පැය ගණන)<br><br>(පදනම් පාඨමාලාවක් ද ඇතුළත්ය).<br><br>(This course includes mathematical processes used in estimating cost of a new building construction, improvement, or reproduction.) | ඉංග්‍රීසි මාධ්‍යය<br>ගාල්ල<br>රත්මලාන | ➢ ඉංජිනේරු සැලසුම් ශිල්පය පිළිබඳ ජාතික සහතිකය<br>➢ගොඩනැගිලි ඉදිකිරීම් ශිල්පී (පෙදරේරු)<br>➢ලී වැඩ ශිල්පී (ඉදිකිරීම්)<br>➢ඉදිකිරීම් ක්ෂේත්‍ර පරීක්ෂක<br>➢ජලනල ශිල්පී<br>➢කර්මාන්ත ජලනල ශිල්පී<br>➢සහකාර ප්‍රමාණ සමීක්ෂණ<br>➢ගොඩනැගිලි සේවා තාක්ෂණික ශිල්පී<br><br>ඉහත පාඨමාලාවලින් එකක් සඳහා NVQ මට්ටම් 3/4 සහතික ලබා තිබීම. |
| 18 | ETB 27.1 | සැලසුම් ශිල්පය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව (ගොඩනැගිලි)<br>NVQ මට්ටම් 5<br><br>සති අන්ත/අර්ධ කාල (NVQ Level - 5 සඳහා නියමිත පැය ගණන)<br><br>(පදනම් පාඨමාලාවක්ද ඇතුළත්ය.)<br><br>(This course includes basic drawing concepts, drawings using drafting software, construction detail drawings, architectural detail drawings, setting out and leveling) | ඉංග්‍රීසි මාධ්‍යය<br>රත්මලාන | අවුරුදු දෙකක පළපුරුද්ද සමග ඉංජිනේරු සැලසුම් ශිල්පය පිළිබඳ සහතිකය NVQ මට්ටම් 3 පාඨමාලාවක් හදාරා සහතික ලබා තිබීම;<br>හෝ<br>සැලසුම් ශිල්පය පිළිබඳ සහතිකය NVQ මට්ටම් 4 පාඨමාලාවක් හදාරා සහතික ලබා තිබීම. |

**මෝටර් වාහන අළුත්වැඩියාව හා නඩත්තු ක්ෂේත්‍රය**

*පූර්ණ කාල පාඨමාලා*

| *අනු. අංකය* | *පාඨමාලා සංකේත අංකය* | *පාඨමාලාවේ නම හා ස්වභාවය* | *පැවැත්වෙන තාක්ෂණ/ කාර්මික විද්‍යාලය* | *ඇතුලත්වීමේ සුදුසුකම් පූර්ණ කාලීන පාඨමාලා වයස අවුරුදු 17ත් 29ත් අතර විය යුතුය. අර්ධ කාලීන පාඨමාලා වයස අවුරුදු 17 ට වැඩි විය යුතුය.* |
|---|---|---|---|---|
| **19** | ETB 07 | මෝටර් රථ තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව<br><br>NVQ මට්ටම් 5<br><br>පූර්ණකාල දිවා අවුරුදු 1 1/2<br><br>(පදනම් පාඨමාලාවක්ද ඇතුලත්ය.)<br><br>(This course includes study on proper functioning and maintenance of automobile, two stroke and four stroke engine operating systems and other sub systems related to them) | **ඉංග්‍රීසි මාධ්‍යය**<br>අම්පාර<br>මහනුවර<br>කුරුණෑගල<br>මරදන<br>බදුල්ල<br>මාතර | ➢මෝටර් රථ කාර්මික ශිල්පී<br>➢මෝටර් රථ කාර්මික විදුලි ශිල්පී<br>➢මෝටර් රථ පින්තාරුකරු<br>➢මෝටර් සයිකල් සහ ත්‍රි රෝද රථ කාර්මික<br>➢ත්‍රි රෝද රථ කාර්මික<br><br>ඉහත පාඨමාලාවලින් එකක් සඳහා NVQ මට්ටම් 3/4 සහතික ලබා තිබීම;<br>හෝ<br>අ.පො.ස.(උ.පෙළ) ඉංජිනේරු තාක්ෂණවේදය /ගණිත/ විද්‍යා යන විෂයධාරාවන්ගෙන් අවම වශයෙන් විෂයයන් තුනක් සමත් වීම. (උසස් පෙළ ඉංජිනේරු තාක්ෂණවේදය හැදෑරූ සිසුන් කෙරෙහි ප්‍රමුඛතාවය ලබා දෙනු ලැබේ.);<br>හෝ<br><br>කලා විෂය ධාරාවේ දෘඩ තාක්ෂණය (Hard Technology) යටතේ වූ යාන්ත්‍රික තාක්ෂණය (Mechanical Technology) විෂය සඳහා සම්මාන සාමාර්ථයක් සහිතව විෂයයන් තුනක් සමත්වීම. |

**මෝටර් වාහන අළුත්වැඩියාව හා නඩත්තු ක්ෂේත්‍රය**

*අර්ධ කාල පාඨමාලා*

| *අනු. අංකය* | *පාඨමාලා සංකේත අංකය* | *පාඨමාලාවේ නම හා ස්වභාවය* | *පැවැත්වෙන තාක්ෂණ/ කාර්මික විද්‍යාලය* | *ඇතුලත්වීමේ සුදුසුකම් පූර්ණ කාලීන පාඨමාලා වයස අවුරුදු 17ත් 29ත් අතර විය යුතුය. අර්ධ කාලීන පාඨමාලා වයස අවුරුදු 17 ට වැඩි විය යුතුය.* |
|---|---|---|---|---|
| **20** | ETB 07.1 | මෝටර් රථ තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව<br><br>NVQ මට්ටම් 5<br><br>සති අන්ත/අර්ධ කාල (NVQ Level - 5 සඳහා නියමිත පැය ගණන)<br><br>(පදනම් පාඨමාලාවක් ද ඇතුලත්ය).<br><br>(This course includes study on proper functioning and maintenance of automobile two stroke and four stroke engine operating systems and other sub systems related to them.) | **ඉංග්‍රීසි මාධ්‍යය**<br>යාපනය<br>මරදන<br>බණ්ඩාරවෙල<br>ගම්පහ | ➢මෝටර් රථ කාර්මික ශිල්පී<br>➢මෝටර් රථ කාර්මික විදුලි ශිල්පී<br>➢මෝටර් රථ පින්තාරුකරු<br>➢මෝටර් සයිකල් සහ ත්‍රි රෝද රථ කාර්මික<br>➢ත්‍රි රෝද රථ කාර්මික<br><br>ඉහත පාඨමාලාවලින් එකක් සඳහා **NVQ** මට්ටම් 3/4 සහතික ලබා තිබීම. |

**ශීතකරණ හා වායුසමන ක්ෂේත්‍රය**

*පූර්ණ කාල පාඨමාලා*

| අනු. අංකය | පාඨමාලා සංකේත අංකය | පාඨමාලාවේ නම හා ස්වභාවය | පැවැත්වෙන තාක්ෂණ/ කාර්මික විද්‍යාලය | *ඇතුලත්වීමේ සුදුසුකම් පූර්ණ කාලීන පාඨමාලා වයස අවුරුදු 17ත් 29ත් අතර විය යුතුය. අර්ධ කාලීන පාඨමාලා වයස අවුරුදු 17 ට වැඩි විය යුතුය.* |
|---|---|---|---|---|
| 21 | ETB 08 | ශීතකරණ හා වායු සමන තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව<br><br>**NVQ** මට්ටම් **5**<br><br>පූර්ණ කාල දිවා අවුරුදු 1 1/2<br><br>(පදනම් පාඨමාලාවක් ද ඇතුළත්ය.)<br><br>(This course includes techniques applied for developing more comfortable conditions to improve thermal comfort and indoor air quality) | **ඉංග්‍රීසි මාධ්‍යය**<br>අනුරාධපුර<br>රත්නපුර<br>මහනුවර<br>ගම්පහ<br>කළුතර | ➢ ශීතකරණ හා වායුසමන කාර්මික ශිල්පී<br>➢මෝටර් රථ වායුසමන ශිල්පී<br>➢මෝටර් රථ විදුලි කාර්මික ශිල්පී<br>➢ ගෘහස්ථ විදුලි උපකරණ අළුත්වැඩියා කාර්මික ශිල්පී<br>➢ විදුලි කාර්මික ශිල්පී<br><br>ඉහත පාඨමාලාවලින් එකක් සඳහා NVQ මට්ටම් 3/4 සහතික ලබා තිබීම;<br><br>හෝ<br><br>අ.පො.ස.(උ.පෙළ) ඉංජිනේරු තාක්ෂණවේදය /ගණිතය / විද්‍යාව යන විෂයධාරාවන්ගෙන් අවම වශයෙන් විෂයන් තුනක් සමත් වීම. (උසස් පෙළ ඉංජිනේරු තාක්ෂණවේදය හැදෑරූ සිසුන් කෙරෙහි ප්‍රමුඛතාවය ලබා දෙනු ලැබේ.);<br>හෝ<br><br>කලා විෂය ධාරාවේ දෘඩ තාක්ෂණය (Hard Technology) යටතේ වූ විදුලි තාක්ෂණය (Electrical Technology),විද්‍යුත් තාක්ෂණය (Electronic Technology) යන විෂයන් අතුරින් එක් විෂයක් සඳහා සම්මාන සමාර්ථයක් සහිතව විෂයන් තුනක් සමත්වීම. |

**කෘෂිකාර්මික වගාවන් හා පශු සම්පත් ක්ෂේත්‍රය**

*පූර්ණ කාල පාඨමාලා*

| අනු. අංකය | පාඨමාලා සංකේත අංකය | පාඨමාලාවේ නම හා ස්වභාවය | පැවැත්වෙන තාක්ෂණ/ කාර්මික විද්‍යාලය | *ඇතුලත්වීමේ සුදුසුකම් පූර්ණ කාලීන පාඨමාලා වයස අවුරුදු 17ත් 29ත් අතර විය යුතුය. අර්ධ කාලීන පාඨමාලා වයස අවුරුදු 17 ට වැඩි විය යුතුය.* |
|---|---|---|---|---|
| 22 | ETA 19 | කෘෂි නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව<br><br>**NVQ** 5 සහ **6** මට්ටම් ඒකාබද්ධව පවතී.<br><br>පූර්ණ කාල දිවා අවුරුදු 2 1/2 | **ඉංග්‍රීසි මාධ්‍යය**<br>කුලියාපිටිය<br>සම්මන්තුරේ<br>දඹුල්ල | ➢පැළතවාන් සංවර්ධන සහකාර<br>➢ක්ෂේත්‍ර සහකාර (කෘෂිකර්ම)<br>හෝ<br>➢අ.පො.ස (සා.පෙළ) විභාගයේ කෘෂි කර්මය ඇතුළු විෂයයන් හයකින් (06) එක් වරකදී සමත්වීම, සහ පහත සඳහන් විෂයයන්ගෙන් හතරක් (04) සඳහා සම්මාන සාමාර්ථ ලබා තිබිය යුතුය. පළමු භාෂාව,ගණිතය, විද්‍යාව සහ සමාජ අධ්‍යයනය හෝ |
| | | (පදනම් පාඨමාලාවක් ද ඇතුළත්ය.)<br><br>(This course includes nursery farm, establishment Activities, primary processing of livestock, production, Agricultural products and Agronomic practices of plantation crops, field crops.) | | කෘෂිකර්මය, උද්‍යාන විද්‍යාව, සත්ත්ව පාලනය, ආහාර තාක්ෂණය, මිරිදිය ජීව සම්පත් තාක්ෂණය, සමුද්‍ර ජීව සම්පත් තාක්ෂණය යන විෂයන්ගෙන් එකක් ඇතුළුව;<br>හෝ<br>➢අ.පො.ස.(උ.පෙළ) තාක්ෂණවේදය / විද්‍යාව යන විෂයධාරාවන්ගෙන් අවම වශයෙන් විෂයයන් තුනක් (03) සමත් වීම. (උසස් පෙළ තාක්ෂණවේදය විෂය ධාරාවේ කෘෂිකර්මය විෂය හැදෑරූ සිසුන් කෙරෙහි ප්‍රමුඛතාවය ලබා දෙනු ලැබේ.)<br>හෝ<br>කලා විෂය ධාරාවේ මෘදු තාක්ෂණය (Soft Technology) යටතේ වූ කෘෂි තාක්ෂණය (Agro Technology) හෝ දෘඩ තාක්‍ෂණය (Hard Technology) යටතේ වූ යාන්ත්‍රික තාක්ෂණය (Mechanical Technology) යන විෂයයන්ගෙන් එක් විෂයයක් සඳහා සම්මාන සමාර්ථයක් සහිතව විෂයන් තුනක් (03) සමත්වීම. |
| 23 | ETB 09 | ගොවි යන්ත්‍රෝපකරණ තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව<br><br>**NVQ** මට්ටම් **5**<br><br>පූර්ණ කාල දිවා අවුරුදු 1 1/2<br><br>(පදනම් පාඨමාලාවක්ද ඇතුළත්ය.)<br><br>(This course includes selection, operation, utilization, and maintenance of machinery and mechanical devices related to agricultural activities) | **ඉංග්‍රීසි මාධ්‍යය**<br><br>අනුරාධපුර | ➢තේ කර්මාන්ත ශාලා යාන්ත්‍රික ශිල්පී<br>➢කෘෂි උපකරණ අළුත්වැඩියා කාර්මික ශිල්පී<br>➢ මෝටර් රථ කාර්මික ශිල්පී<br>➢යන්ත්‍ර ශිල්පී<br>➢ ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ අළුත්වැඩියා කාර්මික ශිල්පී<br>➢ ක්ෂේත්‍ර සහකාර (කෘෂිකර්ම)<br>ඉහත පාඨමාලාවලින් එකක් සඳහා NVQ මට්ටම් 3/4 සහතික ලබා තිබීම;<br>හෝ<br><br>අ.පො.ස.(උ.පෙළ) ඉංජිනේරු තාක්ෂණවේදය /ගණිතය / විද්‍යාව යන විෂයධාරාවන්ගෙන් අවම වශයෙන් විෂයන් තුනක් සමත් වීම. (උසස් පෙළ ඉංජිනේරු තාක්ෂණවේදය හැදෑරූ සිසුන් කෙරෙහි ප්‍රමුඛතාවය ලබා දෙනු ලැබේ.)<br>හෝ<br>කලා විෂය ධාරාවේ මෘදු තාක්ෂණය ( Soft Technology) යටතේ වූ කෘෂි තාක්ෂණය - (Agro Technology) හෝ දෘඩ තාක්ෂණය (Hard Technology) යටතේ වූ යාන්ත්‍රික තාක්ෂණය (Mechanical Technology) යන විෂයන් ගෙන් එක් විෂයක් සඳහා සම්මාන සාමාර්ථයක් සහිතව විෂයන් තුනක් (03) සමත්වීම. |
| 24 | ETB 26 | පසු අස්වනු තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමාව<br><br>**NVQ** මට්ටම් **5**<br><br>පූර්ණ කාල දිවා අවුරුදු 1 1/2<br><br>(පදනම් පාඨමාලාවක් ද ඇතුලත්ය.)<br><br>(This course includes activities related to post - harvesting machinery & equipment, Manage storage & transport, crop harvesting, crop processing ) | **ඉංග්‍රීසි මාධ්‍යය**<br>අනුරාධපුරය | ➢පැළතවාන් සංවර්ධන සහකාර<br>➢ක්ෂේත්‍ර සහකාර (කෘෂිකර්ම)<br><br>හෝ<br><br>අ.පො.ස (සා.පෙළ) විභාගයේ කෘෂි කර්මය ඇතුළු විෂයයන් හයකින් (06) එක් වරකදී සමත්වීම, සහ පහත සඳහන් විෂයයන්ගෙන් හතරක් (04) සඳහා සම්මාන සමාර්ථ ලබා තිබිය යුතුය. පළමු භාෂාව,ගණිතය, විද්‍යාව සහ සමාජ අධ්‍යයනය හෝ<br>කෘෂිකර්මය, උද්‍යාන විද්‍යාව, සත්ත්ව පාලනය, ආහාර තාක්ෂණය, මිරිදිය ජීව සම්පත් තාක්ෂණය, සමුද්‍ර ජීව සම්පත් තාක්ෂණය යන විෂයන්ගෙන් එකක් ඇතුළුව;<br><br>හෝ<br><br>➢අ.පො.ස.(උ.පෙළ) තාක්ෂණවේදය / විද්‍යාව යන විෂයධාරාවන්ගේ අවම වශයෙන් විෂයයන් තුනක් (03) සමත් වීම. (උසස් පෙළ තාක්ෂණවේදය විෂය ධාරාවේ කෘෂිකර්මය විෂය හැදෑරූ සිසුන් කෙරෙහි ප්‍රමුඛතාවය ලබා දෙනු ලැබේ.);<br><br>හෝ<br><br>කලා විෂය ධාරාවේ මෘදු තාක්ෂණය (Soft Technology) යටතේ වූ කෘෂි තාක්ෂණය (Agro Technology) හෝ දෘඩ තාක්‍ෂණය (Hard Technology) යටතේ වූ යාන්ත්‍රික තාක්ෂණය (Mechanical Technology) යන විෂයයන්ගෙන් එක් විෂයයක් සඳහා සම්මාන සමාර්ථයක් සහිතව විෂයන් තුනක් (03) සමත්වීම. |

**තොරතුරු සන්නිවේදන හා බහුමාධ්‍ය තාක්‍ෂණ ක්ෂේත්‍රය**

*පූර්ණ කාල පාඨමාලා*

| *අනු. අංකය* | *පාඨමාලා සංකේත අංකය* | *පාඨමාලාවේ නම හා ස්වභාවය* | *පැවැත්වෙන තාක්ෂණ/ කාර්මික විද්‍යාලය* | *ඇතුලත්වීමේ සුදුසුකම් පූර්ණ කාලීන පාඨමාලා වයස අවුරුදු 17ත් 29ත් අතර විය යුතුය. අර්ධ කාලීන පාඨමාලා වයස අවුරුදු 17 ට වැඩි විය යුතුය.* |
|---|---|---|---|---|
| 25 | ETB 11 | තොරතුරු සහ සන්නිවේදන තාක්‍ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව<br><br>**NVQ** මට්ටම් **5**<br><br>පූර්ණ කාල දිවා අවුරුදු 1 1/2<br><br>(පදනම් පාඨමාලාවක්ද ඇතුළත්ය.) | <u>ඉංග්‍රීසි මාධ්‍යය</u><br><br>අම්පාර<br>අනුරාධපුර<br>බදුල්ල<br>ගාල්ල<br>යාපනය<br>මහනුවර<br>කුරුණෑගල<br>මරදන<br>රත්නපුර<br>කෑගල්ල<br>මාතලේ<br>වවුනියාව | ■ තොරතුරු සන්නිවේදන තාක්ෂණ ශිල්පී<br>■ පරිගණක යෙදවුම් සහායක<br>■ පරිගණක"ග්‍රැෆික්ඩිසයින්" ශිල්පී<br>■ පරිගණක දෘඩාංග ශිල්පී<br>■ පරිගණක ප්‍රකාශන ශිල්පී (Desktop publisher)<br>■ පරිගණක ජාලකරණ ශිල්පී<br>(ඉහත පාඨමාලාවලින් එකක් සඳහා NVQ මට්ටම් 3/4 සහතික ලබා තිබීම;<br>හෝ<br>කලා විෂය ධාරාවේ දෘඩ තාක්ෂණය (Hard Technology) යටතේ වූ තොරතුරු තාක්ෂණය (ICT) විෂයට සම්මාන සාමාර්ථයක් සහිතව විෂයයන් තුනක් සමත්වීම. |

**තොරතුරු සන්නිවේදන හා බහුමාධ්‍ය තාක්ෂණ ක්ෂේත්‍රය**

*අර්ධ කාල පාඨමාලා*

| *අනු. අංකය* | *පාඨමාලා සංකේත අංකය* | *පාඨමාලාවේ නම හා ස්වභාවය* | *පැවැත්වෙන තාක්ෂණ/ කාර්මික විද්‍යාලය* | *ඇතුලත්වීමේ සුදුසුකම් පූර්ණ කාලීන පාඨමාලා වයස අවුරුදු 17ත් 29ත් අතර විය යුතුය. අර්ධ කාලීන පාඨමාලා වයස අවුරුදු 17 ට වැඩි විය යුතුය.* |
|---|---|---|---|---|
| 26 | ETB 11.1 | තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව<br><br>**NVQ** මට්ටම් **5**<br><br>සති අන්ත/අර්ධ කාල (NVQ Level - 5 සඳහා නියමිත පැය ගණන)<br><br>(පදනම් පාඨමාලාවක් ද ඇතුළත්ය) | <u>ඉංග්‍රීසි මාධ්‍යය</u><br><br>අනුරාධපුරය<br>ගාල්ල<br>යාපනය<br>මහනුවර<br>මරදන<br>රත්නපුර | ■තොරතුරු සන්නිවේදන තාක්ෂණ ශිල්පී<br>■ පරිගණක යෙදවුම් සහායක<br>■පරිගණක චිත්‍රකරණය ශිල්පී<br>■පරිගණක දෘඩාංග ශිල්පී<br>■පරිගණක ප්‍රකාශන ශිල්පී (Desktop publisher)<br>■පරිගණක ජාලකරණ ශිල්පී)<br>ඉහත පාඨමාලාවලින් එකක් සඳහා NVQ මට්ටම් 3/4 සහතික ලබා තිබීම. |

**ලෝහ හා මෘදු ලෝහ ඉංජිනේරු ක්ෂේත්‍රය**

*පූර්ණ කාල පාඨමාලා*

| *අනු. අංකය* | *පාඨමාලා සංකේත අංකය* | *පාඨමාලාවේ නම හා ස්වභාවය* | *පැවැත්වෙන තාක්ෂණ/ කාර්මික විද්‍යාලය* | *ඇතුලත්වීමේ සුදුසුකම් පූර්ණ කාලීන පාඨමාලා වයස අවුරුදු 17ත් 29ත් අතර විය යුතුය. අර්ධ කාලීන පාඨමාලා වයස අවුරුදු 17 ට වැඩි විය යුතුය.* |
|---|---|---|---|---|
| 27 | ETB 12 | පෑස්සුම් තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව<br><br>**NVQ** මට්ටම් **5**<br><br>පූර්ණ කාල දිවා අවුරුදු 1 1/2<br><br>(පදනම් පාඨමාලාවක් ද ඇතුළත්ය.) | <u>ඉංග්‍රීසි මාධ්‍යය</u><br>මරදාන<br>කුරුණෑගල | ➢ පෑස්සුම්කරු<br>➢ ලෝහ පිරිසකරකරු<br>➢ මෝටර් වාහන වැද්දුම් ශිල්පී<br>➢ වැද්දුම්කරු / යන්ත්‍ර ශිල්පී<br><br>ඉහත පාඨමාලාවලින් එකක් සඳහා NVQ මට්ටම් 3/4 සහතික ලබා තිබීම;<br>හෝ<br>අ.පො.ස (සා.පෙ.) සම්මාන 04ක් සහිතව විෂයයන් 06ක් සමත් වීම. (ගණිතය සහ විද්‍යාව සමත්වීම අනිවාර්ය වේ.)<br><br>(උසස් පෙළ හැදෑරූ සිසුන් කෙරෙහි ප්‍රමුඛතාවය ලබා දෙනු ලැබේ.) |
| **28** | ETB 16 | නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව<br><br>**NVQ** මට්ටම් **5**<br><br>පූර්ණ කාල දිවා අවුරුදු 1 1/2<br><br>(පදනම් පාඨමාලාවක් ද ඇතුළත්ය.)<br><br>(This course includes the Technology related to Designing of Machine Components, Manufacturing Drawings, Analyzing of Product's quality, computer numerical, control machines and engineering materials) | <u>ඉංග්‍රීසි මාධ්‍යය</u><br>මහනුවර<br>මරදාන | ➢ඇළුමිනියම් පිරිසකර කරන්නා<br>➢යන්ත්‍ර ශිල්පී<br>➢ආවුධ සහ අච්චු තැනීමේ ශිල්පී<br>➢පෑස්සුම් ශිල්පී<br>➢ලෝහ පිරිසකරකරු<br>➢ වැද්දුම්කරු<br><br>ඉහත පාඨමාලාවලින් එකක් සඳහා NVQ මට්ටම් 3/4 සහතික ලබා තිබීම;<br>හෝ<br>අ.පො.ස.(උ.පෙළ) ඉංජිනේරු තාක්ෂණවේදය/ගණිත/විද්‍යා යන විෂයධාරාවන්ගෙන් අවම වශයෙන් විෂයන් තුනක් සමත් වීම. (උසස් පෙළ ඉංජිනේරු තාක්ෂණවේදය හැදෑරූ සිසුන් කෙරෙහි ප්‍රමුඛතාවය ලබා දෙනු ලැබේ.);<br><br>හෝ<br><br>කලා විෂය ධාරාවේ දෘඩ තාක්ෂණය (Hard Technology) යටතේ වූ යාන්ත්‍රික තාක්ෂණය (Mechanical Technology) විෂයට සම්මාන සාමාර්ථයක් සහිතව විෂයන් තුනක් (03) සමත්වීම. |

**ලෝහ හා මෘදු ලෝහ ඉංජිනේරු ක්ෂේත්‍රය**

*අර්ධ කාල පාඨමාලා*

| *අනු. අංකය* | *පාඨමාලා සංකේත අංකය* | *පාඨමාලාවේ නම හා ස්වභාවය* | *පැවැත්වෙන තාක්ෂණ/ කාර්මික විද්‍යාලය* | *ඇතුලත්වීමේ සුදුසුකම් පූර්ණ කාලීන පාඨමාලා වයස අවුරුදු 17ත් 29ත් අතර විය යුතුය. අර්ධ කාලීන පාඨමාලා වයස අවුරුදු 17 ට වැඩි විය යුතුය.* |
|---|---|---|---|---|
| 29 | ETB 12.1 | පෑස්සුම් තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව<br><br>**NVQ** මට්ටම් **5**<br><br>සති අන්ත/අර්ධ කාල (NVQ Level - 5 සඳහා නියමිත පැය ගණන)<br><br>(පදනම් පාඨමාලාවක්ද ඇතුළත්ය.) | <u>ඉංග්‍රීසි මාධ්‍යය</u><br>මරදාන | ➢ පෑස්සුම්කරු<br>➢ ලෝහ පිරිසකරකරු<br>➢ මෝටර් වාහන වැද්දුම් ශිල්පී<br>➢ වැද්දුම්කරු/ යන්ත්‍ර ශිල්පී<br><br>ඉහත පාඨමාලාවලින් එකක් සඳහා NVQ මට්ටම් 3/4 සහතික ලබා තිබීම. |

**ආහාර තාක්ෂණ ක්ෂේත්‍රය**

*පූර්ණ කාල පාඨමාලා*

| *අනු. අංකය* | *පාඨමාලා සංකේත අංකය* | *පාඨමාලාවේ නම හා ස්වභාවය* | *පැවැත්වෙන තාක්ෂණ/ කාර්මික විද්‍යාලය* | *ඇතුලත්වීමේ සුදුසුකම් පූර්ණ කාලීන පාඨමාලා වයස අවුරුදු 17ත් 29ත් අතර විය යුතුය. අර්ධ කාලීන පාඨමාලා වයස අවුරුදු 17 ට වැඩි විය යුතුය.* |
|---|---|---|---|---|
| 30 | ETA 20 | ආහාර තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව<br><br>**NVQ 5** සහ 6 මට්ටම් ඒකබද්ධව පවතී<br><br>පූර්ණ කාල දිවා අවුරුදු 2 1/2<br><br>(පදනම් පාඨමාලාවක් ද ඇතුළත්ය.)<br><br>(This course includes the subjects of analytical Chemistry, Biotechnology, Nutrition, Quality Control, and Food Safety, Management for Selection, Preservation, Processing, Packaging, Distribution, and Use of Safe Food) | <u>ඉංග්‍රීසි මාධ්‍යය</u><br>මහනුවර | ➢බේකරි ශිල්පී<br>➢පළතුරු සහ එළවළු සැකසුම් ශිල්පී<br>➢සූපවේදී<br><br>ඉහත පාඨමාලාවලින් එකක් සඳහා NVQ මට්ටම් 3/4 සහතික ලබා තිබීම;<br>හෝ<br>අ.පො.ස.(උ.පෙළ) ජෛව තාක්ෂණවේදය / විද්‍යාව / යන විෂයධාරාවන්ගෙන් අවම වශයෙන් විෂයයන් තුනක් සමත් වීම. (උසස් පෙළ ජෛව තාක්ෂණවේදය හැදෑරූ සිසුන් කෙරෙහි ප්‍රමුඛතාවය ලබා දෙනු ලැබේ.)<br>හෝ<br>කලා විෂය ධාරාවේ මෘදු තාක්ෂණය ( Soft Technology) යටතේ වූ ආහාර තාක්ෂණය (Food Technology) කෘෂි තාක්ෂණය - (Agro Technology) යන විෂයයන්ගෙන් එක් විෂයයක් සඳහා සම්මාන සමාර්ථයක් සහිතව විෂයයන් තුනක් (03) සමත්වීම. |
| 31 | ETB 14 | ආහාර තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව<br><br>**NVQ** මට්ටම් **5**<br><br>පූර්ණ කාල දිවා අවුරුදු 1 1/2<br><br>(පදනම් පාඨමාලාවක් ද ඇතුළත් ය.)<br><br>(This course includes the subjects of analytical Chemistry, Biotechnology, Nutrition, Quality Control, and food Safety Management for Selection, Preservation, Processing, Packaging, Distribution, and Use of Safe Food) | <u>ඉංග්‍රීසි මාධ්‍යය</u><br>මහනුවර<br>කුලියාපිටිය | ➢ බේකරි ශිල්පී<br>➢පළතුරු සහ එළවළු සැකසුම් ශිල්පී<br>➢ සූපවේදී<br>ඉහත පාඨමාලාවලින් එකක් සඳහා NVQ මට්ටම් 3/4 සහතික ලබා තිබීම;<br>හෝ<br>අ.පො.ස.(උ.පෙළ) ජෛව තාක්ෂණවේදය / විද්‍යා/කෘෂි විද්‍යා යන විෂයධාරාවන්ගෙ න් අවම වශයෙන් විෂයයන් තුනක් සමත් වීම. (උසස් පෙළ ජෛව තාක්ෂණවේදය හැදෑරූ සිසුන් කෙරෙහි ප්‍රමුඛතාවය ලබා දෙනු ලැබේ.)<br>හෝ<br>කලා විෂය ධාරාවේ මෘදු තාක්ෂණ (Soft Technology) යටතේ වූ ආහාර තාක්ෂණය (Food Technology) කෘෂි තාක්ෂණය - (Agro Technology) යන විෂයයන්ගෙන් එක් විෂයක් සඳහා සම්මාන සමාර්ථයක් සහිතව විෂයයන් තුනක් (03) සමත්වීම. |

**මැණික් හා ස්වර්ණාභරණ ක්ෂේත්‍රය**

*පූර්ණ කාල පාඨමාලා*

| *අනු. අංකය* | *පාඨමාලා සංකේත අංකය* | *පාඨමාලාවේ නම හා ස්වභාවය* | *පැවැත්වෙන තාක්ෂණ/ කාර්මික විද්‍යාලය* | *ඇතුලත්වීමේ සුදුසුකම් පූර්ණ කාලීන පාඨමාලා වයස අවුරුදු 17ත් 29ත් අතර විය යුතුය. අර්ධ කාලීන පාඨමාලා වයස අවුරුදු 17 ට වැඩි විය යුතුය.* |
|---|---|---|---|---|
| 32 | ETB 15 | ස්වර්ණාභරණ නිර්මාණය හා නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව<br><br>**NVQ** මට්ටම් **5**<br><br>පූර්ණ කාල දිවා අවුරුදු 1 1/2<br><br>(පදනම් පාඨමාලාවක් ද ඇතුළත් ය.)<br><br>(This course includes developing design Concepts, Technical Drawing and Production Creation, Modern Designing, Quality Checking.) | <u>ඉංග්‍රීසි මාධ්‍යය</u><br>මරදාන | ➢ස්වර්ණාභරණ සාදන්නා<br>➢ස්වර්ණාභරණ ගල් බැඳුම් ශිල්පී<br><br>ඉහත පාඨමාලාවලින් එකක් සඳහා NVQ මට්ටම් 3/4 සහතික ලබා තිබීම;<br>*හෝ*<br>අ.පො.ස.(උ.පෙළ) ඉංජිනේරු තාක්ෂණවේදය /විද්‍යා / කලා යන විෂයධාරාවන්ගෙන් අවම වශයෙන් විෂයයන් තුනක් සමත් වීම. |

**මුදල් හා බැංකු කළමණාකරන ක්ෂේත්‍රය**

*පූර්ණ කාල පාඨමාලා*

| *අනු. අංකය* | *පාඨමාලා සංකේත අංකය* | *පාඨමාලාවේ නම හා ස්වභාවය* | *පැවැත්වෙන තාක්ෂණ/ කාර්මික විද්‍යාලය* | *ඇතුලත්වීමේ සුදුසුකම් පූර්ණ කාලීන පාඨමාලා වයස අවුරුදු 17ත් 29ත් අතර විය යුතුය. අර්ධ කාලීන පාඨමාලා වයස අවුරුදු 17 ට වැඩි විය යුතුය.* |
|---|---|---|---|---|
| 33 | BSA 01 | ගිණුම්කරණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව<br><br>**NVQ 5 සහ 6 මට්ටම් ඒකාබද්ධව පවතී.**<br><br>පූර්ණ කාල දිවා දැවුරුදු<br><br>(පදනම් පාඨමාලාවක් ද ඇතුළත් ය.)<br><br>(This course includes subjects related to Accounting, Costing, Auditing, Taxation Management and other related subjects.) | **ඉංග්‍රීසි මාධ්‍යය**<br>අම්පාර<br>ගාල්ල<br>මහනුවර<br>කුරුණෑගල<br>මරදාන<br>මඩකලපුව<br>කෑගල්ල<br>සමන්තුරය<br>කුලියාපිටිය<br>**සිංහල මාධ්‍යය**<br>අම්පාර<br>ගාල්ල<br>මහනුවර<br>කුරුණෑගල<br>මරදාන<br>හෝමාගම<br>බෙලිඅත්ත<br>කෑගල්ල<br>මාතර<br>කුලියාපිටිය<br>**දෙමළ මාධ්‍යය**<br>යාපනය<br>වව්නියාව<br>අක්කරෙයිපත්තුව | අ.පො.ස.(සා.පෙළ) විභාගයෙන් ගණිතය සහ ඉංග්‍රීසි විෂය ඇතුළුව විෂයයන් හයකින් (06) සමත්වීම;<br>*සහ*<br>අ.පො.ස (උ.පෙළ) විභාගයෙන් ගණකාධිකරණය, සංයුක්ත ගණිතය, ව්‍යාපාර අධ්‍යයනය, ආර්ථික විද්‍යාව, ව්‍යාපාර සංඛ්‍යානය යන විෂයයන් අතුරින් එකක් (01) සහිතව විෂයයන් තුනකින් (03) සමත්වීම;<br>*හෝ*<br>කාර්මික අධ්‍යාපන හා පුහුණුකිරීමේ දෙපාර්තමේන්තුවේ තාක්ෂණ / කාර්මික විද්‍යාලයන්හි පැවැත්වෙන ගණක ශිල්පීන් සඳහා වූ ජාතික සහතික පත්‍ර පාඨමාලාව හදාරා සමත්ව තිබීම. |

**අධ්‍යාපන ක්ෂේත්‍රය**

*පූර්ණ කාල පාඨමාලා*

| *අනු. අංකය* | *පාඨමාලා සංකේත අංකය* | *පාඨමාලාවේ නම හා ස්වභාවය* | *පැවැත්වෙන තාක්ෂණ/ කාර්මික විද්‍යාලය* | *ඇතුලත්වීමේ සුදුසුකම් පූර්ණ කාලීන පාඨමාලා වයස අවුරුදු 17ත් 29ත් අතර විය යුතුය. අර්ධ කාලීන පාඨමාලා වයස අවුරුදු 17 ට වැඩි විය යුතුය.* |
|---|---|---|---|---|
| 34 | ETB19 | ඉංග්‍රීසි සහ අධ්‍යාපනය පිළිබඳ ඩිප්ලෝමාව (Diploma in English and Education)<br><br>**NVQ** මට්ටම් **5**<br><br>පූර්ණකාල දිවා අවුරුදු 1 | **ඉංග්‍රීසි මාධ්‍යය**<br>අම්පාර<br>ගාල්ල<br>යාපනය<br>කුරුණෑගල<br>මරදාන<br>බෙලිඅත්ත<br>කළුතර<br>කුලියාපිටිය<br>මාතර<br>සමන්තුරේ<br>වවුනියාව | උසස් වෘත්තීය කුසලතාව පිළිබඳ ඉංග්‍රීසි (NVQ Level 4) සහතිකය. (Advancing Career Skills NVQ Level 4)<br>*හෝ*<br>වාණිජ කර්මාන්ත සඳහා ඉංග්‍රීසි ජාතික සහතිකය ලබා තිබීම (NCE).<br>*හෝ*<br>වෘත්තීය ඉංග්‍රීසි ජාතික සහතිකය ලබා තිබීම (NCPE) .<br>*හෝ*<br>රැකියා අපේක්ෂිතයින් සඳහා ඉංග්‍රීසි පාඨමාලාව හදාරා සහතිකය ලබා තිබීම. (CJS)<br>*හෝ*<br>අ.පො.ස (උ.පෙළ) විභාගයෙන් සාමාන්‍ය ඉංග්‍රීසි (General English) විෂයට සාමාර්ථයක් සහිතව විෂයයන් තුනකින් (03) සමත්වීම. |
| 35 | ETA 23 | ඉංග්‍රීසි සහ අධ්‍යාපනය පිළිබඳ උසස් ඩිප්ලෝමාව (Higher National Diploma in English and Education)<br><br>NVQ මට්ටම් 6<br><br>පූර්ණකාල දිවා අවුරුදු 1 | **ඉංග්‍රීසි මාධ්‍යය**<br><br>අම්පාර<br>කුරුණෑගල<br>සමන්තුරේ | ඉංග්‍රීසි සහ අධ්‍යාපනය පිළිබඳ ඩිප්ලෝමාව (Diploma in English and Education) NVQ Level 5 පාඨමාලාව හදාරා තිබීම.<br>හෝ<br>ඉංග්‍රීසි පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමා සහතිකය SLIATමගින් ලබා තිබීම.<br>හෝ<br>ඉංග්‍රීසි විෂය ඇතුළුව අ.පො.ස. උසස් පෙළ විෂයන් 3ක් සමත්වීම. (සාමාන්‍ය පෙළ ඉංග්‍රීසි විෂය නොවේ) |

12-603

**අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය**

ශ්‍රී ලංකා විදුහල්පති සේවය සඳහා වූ ඉංග්‍රීසි භාෂා පරීක්ෂණය 2018

අංක 1885/31 හා 2014.10.22 දිනැති ශ්‍රී ලංකා විදුහල්පති සේවා ව්‍යවස්ථාවට අනුව ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ නිලධාරීන් සඳහා වන භාෂා පරීක්ෂණය 2019 අප්‍රේල් මස කොළඹදී පැවැත්වෙන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

02. විදුහල්පති සේවයේ සෑම නිලධාරියෙකුම බඳවා ගැනීමේ දින සිට වසර (03) ක් ඇතුළත සන්ධාන භාෂාව පිළිබඳ ප්‍රවීණතාවය ලබා ගත යුතුය. නිලධාරියකු අ.පො.ස. (සා.පෙ) විභාගයේ දී ඉංග්‍රීසි විෂය සඳහා අවම වශයෙන් සම්මාන සාමර්ථයක් හෝ ඊට ඉහළ සාමර්ථයක් ලබා තිබේ නම් ඉංග්‍රීසි භාෂා පරීක්ෂණය සමත් වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කරනු ලැබේ. සෙසු නිලධාරීන් මෙම පරීක්ෂණය සමත් විය යුතු ය.

03. මෙම විභාගයට අදාළ විෂය නිර්දේශය හා අනෙකුත් විධිවිධාන අංක 1885/31 දරන 2014.10.22 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශේෂ ගැසට් පත්‍රයේ* පළ කර ඇත. අයදුම්කරුවන්ගේ පහසුව සඳහා එම විෂය නිර්දේශය හා අනෙකුත් විධිවිධාන පහත දක්වා ඇත.

(අ) විභාග පටිපාටිය - විෂය නිර්දේශය පහත පරිදි වේ.

(1) සාමාන්‍ය ඉංග්‍රීසි (General English)
ලකුණු 100 - කාලය පැය 03

**විෂය නිර්දේශය**

Suitable level of proficiency on the following forms of grammar in the written language is expected from the candidate:
- Tenses and Numbers
- Sentences (Simple/Compound/Complex/Compound Complex)
- Relative Clauses
- Reported Speech
- Adjectives and Adverbs
- Determiners
- Prepositions

The knowledge on the modern formats and styles of writing is tested in following area of study :-

- Summary writing
- Report writing
- Essay writing

04. සාමර්ථය ලැබීම සඳහා මෙම විෂයට අපේක්ෂකයකු අවම වශයෙන් 40% ක හෝ ඊට වැඩි ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතුය.

4.1. විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන්ගේ ප්‍රතිඵල ඇතුළත් ප්‍රතිඵල ලේඛනය ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ලබා දෙනු ඇත. විභාග අපේක්ෂකයින් වෙත පෞද්ගලික ප්‍රතිඵල ලේඛන නිකුත් කිරීම විභාග කොමසාරිස් ජනරාල් විසින් සිදු නොකරනු ඇත.

05. පහත දක්වෙන ආකෘතියට අනුව, ඉල්ලුම් පත්‍රයේ අංක 01 සිට 04 තෙක් වූ ශීර්ෂ පළමුවන පිටුවටද ඉතිරිය අනෙක් පිටුවලට ද ඇතුළත් වන පරිදි ඉල්ලුම්පත්‍රය සකස් කළ යුතු අතර ඊට අදාළ තොරතුරු විභාගයට ඉල්ලුම් කරන මාධ්‍යයෙන් තම අත් අකුරින්ම පැහැදිලිව සම්පූර්ණ කළ යුතුය. සම්පූර්ණ කරන ලද ඉල්ලුම් පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇති බව දන්වමි. තවද සම්පූර්ණ කරනු ලබන ඉල්ලුම් පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ ඉල්ලුම් පත්‍රයට අනුකූලද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු අතර ආදර්ශ ඉල්ලුම් පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම් පත්‍ර හා අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති ඉල්ලුම් පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කෙරේ. තවද ඉල්ලුම් පත්‍රය යොමු කිරීමට ප්‍රථම නියමිත විභාග ගාස්තු ගෙවා එහි විස්තර ඉල්ලුම් පත්‍රයට ඇතුළත් කොට ලදුපත අලවා ඇත්ද යන්න පිළිබඳ නැවත විමසිලිමත් විය යුතු බවත්, සම්පූර්ණ කරන ලද ඉල්ලුම් පත්‍රයේ හා විභාග ගාස්තුවට අදාළ ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇති බවත් දන්වමි. ඉල්ලුම් පත්‍රය පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල ඉල්ලුම් පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන්ද, දෙමළ ඉල්ලුම් පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන්ද යෙදීම අවශ්‍ය බව දන්වමි.

06. විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාගය පවත්වනු ලබන අතර, එය පැවැත්වීම සඳහා ඔහු විසින් පනවා ඇති නීති රීති පිළිපැදීමට අපේක්ෂකයෝ බැඳී සිටිති. විභාගය සඳහා වන නීති රීති මෙම නිවේදනය අවසානයේ පළ කොට ඇත.

07. ඉල්ලුම් පත්‍ර 2019 ජනවාරි 21 වැනි දින හෝ ඊට ප්‍රථම විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන (ආයතනික හා විදේශ විභාග) ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ.පෙ. 1503, කොළඹ ලිපිනයට ලැබෙන පරිදි විදුහල්පති / කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂ / කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ හෝ අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ / පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ මඟින් හෝ ඔබේ සේවා ප්‍රධානියා මඟින් ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ඉල්ලුම් පත්‍රය බහා එවන ලියුම් කවරයේ වමත් පස ඉහළ කෙළවරේ විභාගයේ නම පැහැදිළිව ලිවිය යුතු අතර මෙදිනට පසු එවනු ලබන ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

08. අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් නිවේදනයක් පුවත්පත්වල හා ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තු නිල වෙබ් අඩවියේ පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 02 ක් හෝ 03 ක් ගතවූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුයි. එසේ දැන්වීමේදී අයදුම්කරුගේ සම්පූර්ණ නම, ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය හා අයදුම් කළ විභාගයේ නම සඳහන් කළ යුතුය. කොළඹින් බැහැර අයදුම්කරුවකු නම් එම විස්තර සමඟ ප්‍රවේශ පත්‍රයේ පිටපතක් එවිය හැකි ෆැක්ස් අංකයක් ද සහිත ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කර විමසීම වඩාත් ඵලදායී වේ. විභාග දෙපාර්තමේන්තුවෙන් විමසන අවස්ථාවේ අවශ්‍ය වුවහොත් අයදුම්කරුගේ අපේක්ෂකත්වය තහවුරු කිරීම සඳහා තමා ළඟ තබා ගත් ඉල්ලුම් පත්‍රයේ පිටපත, විභාග ගාස්තු ගෙවීම අදාළ වේ නම් ඒ සඳහා වූ ලදුපතේ පිටපත හා ඉල්ලුම් පත්‍රය තැපැල් කිරීමේදී ලියාපදිංචි කරන ලද කුවිතාන්සිය ද සූදානමින් තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

09. ඉල්ලුම් පත්‍රයේ ද විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ ද අයදුම්කරුගේ අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා සහතික කර තිබිය යුතුය. අපේක්ෂකයකු තමාට නියම කර ඇති විභාග ශාලාවේදී නියමිත විභාග අංකය යටතේ විභාගයට පෙනී සිටිය යුතු අතර විභාග දින තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රය ශාලාධිපති වෙත භාර දිය යුතුය. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

10. විභාග ශාලාවේදී තමන්ගේ අනන්‍යතාව තහවුරු කිරීම සඳහා සාක්ෂි ඉදිරිපත් කිරීම අපේක්ෂකයින්ගේ වගකීම වේ. ඒ සඳහා,

(i) ජාතික හැඳුනුම්පත හෝ,
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය හෝ,
(iii) වලංගු රියදුරු බලපත්‍රය හෝ,
පමණක් පිළිගනු ලැබේ.

11. විභාග ගාස්තු :

(අ) මෙම විභාගය සඳහා අයකරන ලද ගාස්තු මොනයම් හේතුවක් මත හෝ ආපසු ගෙවනු නොලබන අතර වෙනත් විභාගයක ගාස්තුවකට මාරු කිරීමටද ඉඩ දෙනු නොලැබේ. තවද විභාග ගාස්තුව සඳහා මුදල් ඇණවුම් හෝ මුද්දර භාරගනු නොලබන අතර විභාග ගාස්තු ගෙවන ලද ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

(අ) පළමුවැනි වතාවේදී ගාස්තු අයකරනු නොලැබේ.

(ආ) ඊට පසු එක් එක් වතාව සඳහා රු. 250 බැගින් අය කරනු ලැබේ.

මෙම විභාග ගාස්තුව විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 20-03-02-13 ට බැරවන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම තැපැල් කාර්යාලයකට ගෙවා ලබා ගන්නා ලදුපත ඉල්ලුම් පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ අලවා එවිය යුතුය. ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

12. විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීති වලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇති බව දන්වමි.

13. සිංහල, ඉංග්‍රීසි හා දෙමළ මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැලපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

14. තවද මෙම නිවේදනය මගින් ආවරණය නොවන කිසියම් කාරණයක් වෙතොත් ඒ පිළිබඳව තීරණය කිරීමේ අයිතිය අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා සතුය.

පද්මසිරි ජයමාන්න,
ලේකම්,
අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය.

2018 දෙසැම්බර් මස 04 වැනි දින,
පැලවත්ත, ඉසුරුපාය, අධ්‍යාපන අමාත්‍යාංශයේ දී ය.

*ආදර්ශ ඉල්ලුම් පත්‍රය*

**ශ්‍රී ලංකා විදුහල්පති සේවය සඳහා වූ ඉංග්‍රීසි භාෂා පරීක්ෂණය - 2018**
**English Language Test for the Sri Lanka Principals Service – 2018**

(විදුහල්පති/ කොට්ඨාස හෝ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ/ අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ/ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ මගින් විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන (ආයතනික හා විදේශ විභාග) ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ. පෙ. 1503, කොළඹ වෙත ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කරන්න. විභාගයේ නම කවරයේ වමත් පස ඉහළ කෙළවරේ සඳහන් කළ යුතුය.)

1. (අ) මුලකුරු අගය යොදා මුලකුරු සමඟ නම :————.
(මුල් අකුරු සමඟ ඉංග්‍රීසි කැපිටල් අකුරින්) උදා :- (GUNAWARDHANA, M.G.B.S.K)
(ආ) සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

2. ලිපිනය :
(i) පෞද්ගලික :————.
(ii) රාජකාරී :————.
(iii) ප්‍රවේශපත්‍රය එවිය යුතු ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්)

3. (i) ස්ත්‍රී/පුරුෂ භාවය :
ස්ත්‍රී - 1
පුරුෂ - 0 ☐
(අදළ අංකය කොටුව තුළ ලියන්න)

(ii) ජාතික හැඳුනුම්පත් අංකය : [ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ]

(iii) උපන් දිනය : වර්ෂය [ ][ ][ ][ ] මාසය [ ][ ] දිනය [ ][ ]

4. දුරකතන අංකය :

i. ජංගම - [ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ]

ii. ස්ථාවර - [ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ]

5. විදුහල්පති සේවයේ පන්තිය/ශ්‍රේණිය :—————.
පාසල / කාර්යාලය :—————.
පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව/කලාප අධ්‍යාපන කාර්යාලය :—————.

6. විභාග ගාස්තු ගෙවා ලබා ගත් ලදුපතේ විස්තර :
ලදුපත් අංකය :—————.
තැපැල් කාර්යාලය :—————.
දිනය :—————.

ලදුපත මෙහි අලවන්න

ඉහත සඳහන් තොරතුරු නිවැරදි බව ප්‍රකාශ කරමි. තවද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීති වලට මා එකඟ වෙමි.

—————,
ඉල්ලුම්කරුගේ අත්සන

දිනය :—————.

විභාග කොමසාරිස් ජනරාල්,

ඉහත විස්තර දක්වෙන අපේක්ෂකයා මගින් පාසලේ / කාර්යාලයේ නිලධාරියකු බව සහතික කරමි. තවද අපේක්ෂකයා විභාග ගාස්තුවෙන් නිදහස් බවද/ අපේක්ෂකයා විභාග ගාස්තු සඳහා වන ලදුපත නිවැරදිව අලවා ඇති බව ද සහතික කරමි.

..................................................
විදුහල්පතිගේ/ කොට්ඨාස හෝ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකගේ/
අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂකගේ / පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂකගේ අත්සන.

(විදුහල්පතිවරයකු නම් පාසලේ නම සඳහන් කරන්න)
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

ලිපිනය :—————.
දිනය :—————.
(අදාළ නොවන වචන කපා හරින්න)

12-628

# I වැනි කොටස : (IIආ) වැනි ඡෙදය - පළකිරීම්

## ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

**ලංසු සඳහා ආරාධනයයි (IFB)**

ශ්‍රී ලංකා දුම්රිය සේවය

ශ්‍රී ලංකා දුම්රිය සේවය සඳහා EN 45 EI- (අඩි - 45 R350HT ශ්‍රේණිය)
රේල්පීලි 1500 ප්‍රසම්පාදනය

ලංසු ආරාධනා අංක : SRS F. 7612

ශ්‍රී ලංකාවේ, කොළඹ තැ. පෙ. 355, දුම්රිය මූලස්ථානයේ ශ්‍රී ලංකා දුම්රිය සේවය වෙනුවෙන් අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින්, ශ්‍රී ලංකා දුම්රිය සේවය සඳහා EN 45 EI -අඩි 45 (13.716M) R 350 HT ශ්‍රේණියේ රේල් පීලි 1500ක් සැපයීම සඳහා සුදුසුකම්ලත් හා නිපුණතාපූර්ණ ලංසුකරුවන් වෙතින් මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ. ලංසුකරුවන්හට තම ලංසු ඇටර්නි බලපත්‍රයක් සහිතව පත්කළ නියෝජිතයකු මාර්ගයෙන් ඉදිරිපත් කළ හැක.

02. ජාත්‍යන්තර තරගකාරී ලංසුකරණ ක්‍රියාපටිපාටිය තුළින් මෙම ලංසුකරණය පවත්වනු ලැබේ.

03. උනන්දුවක් දක්වන ලංසුකරුවන්හට අවශ්‍ය වැඩිදුර විස්තර ලබාගැනීමත්, ලංසුලේඛන පරීක්ෂා කොට බැලීමත් පහත සඳහන් ලිපිනයේ දී පෙරවරු 9.00 හා පස්වරු 3.00 අතර කාලය තුළ සිදු කළ හැක.

දුම්රිය ගබඩා අධිකාරි,
දුම්රිය ගබඩා දෙපාර්තමේන්තුව,
ඕල්කොට් මාවත, කොළඹ 10, ශ්‍රී ලංකාව.

දුරකතන අංක : 94(11)2438078 හෝ 94 (11)2436818
ෆැක්ස් අංක : 94(11)2432044
ඊමේල් : srs.slr@gmail.com
වෙබ් අඩවිය : www.railway.gov.lk

04. සුදුසුකම් අවශ්‍යතා අතරට මේවා ද ඇතුළත් ය.

(අ) මෙම කොන්ත්‍රාත්තුව යටතේ සපයනු ලබන භාණ්ඩ,ලංසු ලේඛන සමග නිකුත් කරනු ලබන දුම්රිය ගබඩා පිරිවිතරයන් වන RSS 557 B වලට අනුකූල විය යුතු ය.

(ආ) සපයනු ලබන එක් එක් අයිතමවලට අදළ සැලසුම් හා නිෂ්පාදනයට අදළ ISO 9001 : 2008 ප්‍රමිතියට අයත් ලේඛන පිටපත් ලංසුව සමග ඉදිරිපත් කළ යුතු ය.

(ඇ) තෝරාගත් ලංසුකරුවන්

(i) මෙම කොන්ත්‍රාත්තුවට අයත් භාණ්ඩ සැපයීම සඳහා නෛතික හිමිකම් සතුවිය යුතු ය.

(ii) කිසිදු ලංසුකරුවකු හට බැඳියා පිළිගැටුම් නොතිබිය යුතු ය. එසේ පවත්නා සියලුම ලංසුකරුවන් නුසුදුස්සන් ලෙස සැලකේ. පහත සඳහන් කරුණු මත, මෙම ලංසුකරණ ක්‍රියාපටිපාටිය තුළ දී, පාර්ශව එකක් හෝ කිහිපයක් සමග බැඳියා පිළිගැටුම් පවත්නා ලංසුකරුවන් සලකා බැලෙනු ඇත.

(අ) දැනට හෝ පසුගිය කාලය තුළ ආයතනයක් හෝ එහි අනුබද්ධිත ආයතන සමග සහයෝගිතාවයෙන් මෙම ලංසු ලේඛන යටතේ මිල දී ගනු ලබන භාණ්ඩ ප්‍රසම්පාදනයේ දී භාවිතා කරනු ලබන සැලසුම් සකස් කිරීම, පිරිවිතරයන් හා වෙනත් ලේඛන සඳහා උපදේශන සේවා ලබාදීම සඳහා ගැණුම්කරු විසින් යොදවා තිබීම.

(ආ) එකකට වැඩි ලංසු ප්‍රමාණයක් මෙම ලංසුකරණය සඳහා ඉදිරිපත් කිරීම කෙසේ වෙතත් මෙයින්, ලංසු එකකට වැඩි ගණනක් සඳහා උපකොන්ත්‍රාත්කරුවන්ගේ සහභාගිත්වය සීමා කිරීමක් සිදු නොවේ.

(i) යම් ලංසුකරුවකු ලංසු භාරදෙනු ලබන දිනට හෝ කොන්ත්‍රාත් ප්‍රදනය කරනු ලබන දිනයට ජාතික ප්‍රසම්පාදන නියෝජිතායතනය (NPA) විසින් අයෝග්‍ය ලෙසට ප්‍රකාශිත අයකු වෙතොත් ඔහු නුසුදුස්සෙකු ලෙසට සලකා කටයුතු කෙරේ. එසේ තහනමට ලක් කරන ලද ආයතනවල ලැයිස්තුවක් NPA ආයතනයේ වෙබ් අඩවිය වන www.npa.gov.lk පළ කොට ඇත.

(ii) නිෂ්පාදකයන් සතුව පසුගිය වසර දහය (10) තුළ, ජාත්‍යන්තර තරගකාරී ලංසුකරණ පදනමින් EN 45E1/BS 90A රේල්පීලි (ටොන් 3,000) අවම වශයෙන් 5,000 ක තොගයක් හා වෙනත් රේල්ලු අන්තර්ගතයන් ටොන් 50,000 සහ R 350 HT රේල්පීලි 10,000 ක් EN 13674 ප්‍රමිතීන් යටතේ සැපයීමෙන් භාවිතා කළ සංවිධාන වෙතින් ලද කාර්යසාධන සහතික තිබිය යුතු ය.

(iii) නිෂ්පාදක/නිෂ්පාදකයන් තමන් විසින් පසුගිය වසර දහයක කාලය තුළ EN 45 E1/BS 90 (A) ප්‍රමිතියෙන් අවම වශයෙන් රේලිපීලි 5,000 ක තොග යක් (ටොන් 3,000) සහ වෙනත් රේල්ලු අන්තර්ගතයන් ටොන් 50,000 ක් සහ පසුගිය වසර 03 තුළ R 350 HT රේල්පීලි ටොන් 10,000ක් EN13674 ප්‍රමිතිය ප්‍රකාරව සැපයූ බවට තම රජයෙන් සහතිකයක් රැගෙන ලබා දිය යුතු ය.

05. (අ) යම් පුද්ගලයකු, ඕනෑම ලංසුකරුවකු සඳහා හෝ වෙනුවෙන් හෝ ඒජන්තවරයකු, උපඒජන්තවරයකු හෝ නම්කළ අයකු ලෙස කටයුතු කිරීමට අපේක්ෂා කරන්නේ නම්, 1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් පනත ප්‍රකාරව, ලංසු භාරදීමට පෙර, පොදු කොන්ත්‍රාත් රෙජිස්ට්‍රාර්වරයා වෙත ලියාපදිංචි වී සිටිය යුතු ය. එම සහතිකයේ මුල් පිටපත ලංසුව සමග ඉදිරිපත් කළ යුතු ය. එම මුල් සහතිකය නොමැතිව ඉදිරිපත් කරනු ලබන ලංසු ප්‍රතික්ෂේප කෙරෙනු ඇත.

(ආ) එසේ ම ලංසුකරුවන් ලංසු භාරදුන් වහාම හා කොන්ත්‍රාත් ප්‍රදනයට පෙර, 1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් පනත ප්‍රකාරව ලියාපදිංචි විය යුතු ය. එම පොදු කොන්ත්‍රාත් පනත ප්‍රකාරව නිකුත් කරනු ලබන ලියාපදිංචි සහතිකය ඉදිරිපත් නොකරනු ලබන ලංසුකරුවන් වෙත ප්‍රසම්පාදන ප්‍රදනය කරනු නොලැබේ.

06. ආපසු ගෙවනු නොලබන ප්‍රසම්පාදන ගාස්තු රුපියල් 22,000ක් හෝ නිදහසේ හුවමාරු කළ හැකි සමාන මුදල් වර්ගයකින් ගෙවීමෙන් හා දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලය, ඕල්කොට් මාවත, කොළඹ 10, ශ්‍රී ලංකාව හෝ විදේශයන්හි ශ්‍රී ලංකා තානාපති කාර්යාල වෙත ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන්, 2018.12.06 වැනි දින සිට 2019.01.21 දින පස්වරු 3.00 (ශ්‍රී ලංකා වේලාවෙන්) දක්වා උනන්දුවක් දක්වන ලංසුකරුවන්හට, ඉංග්‍රීසි භාෂාවෙන් සකස් කරන ලද සම්පූර්ණ ලංසු ලේඛන කට්ටලයක් මිලදී ගත හැක.

07. ලංසු පහත සඳහන් ලිපිනයට 2019.01.22 දින පස්වරු 2.00 ට පෙර ලැබීමට සැලැස්විය යුතු ය.

සභාපති,
අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව,
ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය,
07 වන මහල, සෙත්සිරිපාය,
අදියර 11, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.

ප්‍රමාද ලංසු ප්‍රතික්ෂේප කෙරේ. ලැබී ඇති ලංසු 2019.01.22 වැනි දින පස්වරු 2.00 ට බත්තරමුල්ල, සෙත්සිරිපාය, අදියර II හි 07 වන මහලේ, ප්‍රවාහන හා සිවිල් ගුවන්සේවා අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ මණ්ඩල කාමරයේ දී පැමිණ සිටීමට කැමැත්තක් දක්වන ලංසුකරුවන්ගේ නියෝජිතයන්ගේ ඉදිරියේ විවෘත කරනු ලැබේ.

සභාපති,
අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව,
ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය,
07 වන මහල, සෙත්සිරිපාය,
අදියර II, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.

යොමු අංකය : SRS/F.7612

12-624

## බඩු බාහිරාදිය විකිණීම්

**දෙහිඅත්තකණ්ඩිය මහෙස්ත්‍රාත් අධිකරණය**

අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද රාජසන්තක කරනු ලැබූ සහ මෙතෙක් හිමිකම් නොකියන ලද භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

1. දෙහිඅත්තකණ්ඩිය මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවලට අදළව රාජසන්තක කරනු ලැබූ සහ මෙතෙක් හිමිකම් නොකියන ලද සහ කල් තබා ගැනීමේ දී විනාශ වී යා හැකි භාණ්ඩ 2019.01.15 වැනි දින පෙ. ව. 9.00 සිට එම අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේදී විකුණනු ලැබේ.

2. මෙහි සඳහන් වන කිසියම් භාණ්ඩයක් සම්බන්ධයෙන් හිමිකම් පාන්නකු වේ නම් වෙන්දේසි පවත්වන දින වෙන්දේසි ආරම්භ කිරීමට පෙර, ස්වකීය හිමිකම් ඉදිරිපත් කළ යුතු අතර, ඒ පිළිබඳ සලකා බැලීම සඳහා භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කරනු ලැබේ.

3. අධිකරණ රෙජිස්ට්‍රාර්වරියගේ අවසර මත වෙන්දේසි ආරම්භ කිරීමට පැය 1/2කට මත්තෙන් නියමිත භාණ්ඩ පරීක්ෂා කර බැලීමට මහජනයාට ඉඩ දෙනු ලැබේ.

4. අධිකරණය විසින් ඉදිරිපත් කරනු ලබන අවම ලංසුව නොපිළිගැනෙන අවස්ථාවේ දී අධිකරණයේ අභිමතය පරිදි, එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

5. වෙන්දේසියේ භාණ්ඩ මිලදී ගන්නා ගැණුම්කරුවන් තම අනන්‍යතාවය සනාථ කිරීමට ජාතික හැඳුනුම්පත රැගෙන ඒම අනිවාර්යය වේ.

6. භාණ්ඩ මිලදී ගැනීම ලංකාවේ වලංගු මුදලින් කළ යුතු අතර, ඒ සඳහා අධිකරණය මගින් රිසිට්පතක් නිකුත් කරනු ලැබේ.

7. මිලදී ගන්නා භාණ්ඩ, වෙන්දේසි දින ප. ව. 4.30 ට පෙර වෙන්දේසි භූමියෙන් ඉවත් කර ගත යුතුයි.

වාසනා නවරත්න,
මහෙස්ත්‍රාත්,
දෙහිඅත්තකණ්ඩිය.

2018 දෙසැම්බර් මස 05 වැනි දින,
දෙහිඅත්තකණ්ඩිය මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

**වෙන්දේසි භාණ්ඩ ලැයිස්තුව**

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය | ප්‍රමාණය | තක්සේරු වටිනාකම රු. |
|---|---|---|---|---|
| 1. | බී/383/17 | විදුලි වතුර මෝටර් | 01 | 8,000 |
| | | බැටරි | 01 | 500 |
| 2. | 16883 | දුණු තරාදි | 01 | 200 |
| 3. | 17197 | දුණු තරාදි | 01 | 200 |
| 4. | 14809 | ඇලුමිනියම් මුට්ටි | 01 | 100 |
| 5. | 13790 | ප්ලාස්ටික් කල | 01 | 50 |
| 6. | 16601 | සවල් | 04 | 800 |
| | | උදලු | 01 | 100 |
| 7. | 16168 | සවල් | 01 | 200 |
| 8. | 16326 | සවල් | 01 | 200 |
| 9. | 16476 | සවල් | 01 | 200 |
| 10. | 17618 | සවල් | 02 | 400 |
| 11. | 21186 | පොරව | 01 | 200 |
| 12. | 17464 | සවල් | 01 | 200 |
| 13. | 18098 | සවල් | 02 | 400 |
| 14. | 16672 | ලණු පාර්සල් | 01 | 50 |
| | | කැති | 01 | 250 |
| | | හෙල්මට් | 01 | 200 |
| | | ලී 30 හිස් කෑන් | 01 | 50 |
| | | විදුලි පන්දම් | 01 | 50 |
| | | බාල්දි | 01 | 100 |
| 15. | 19880 | පොරව | 01 | 200 |
| 16. | 16674 | ලණු පාර්සල් | 01 | 50 |
| | | කැති | 01 | 250 |
| | | පොරව | 01 | 200 |
| | | බාල්දි | 01 | 100 |
| | | විදුලි පන්දම් | 01 | 50 |
| 17. | 17000 | සවල් | 01 | 200 |
| 18. | 18056 | වේවැල් කූඩ | 01 | 100 |
| | | සවල් | 01 | 200 |
| 19. | 20741 | පොරව | 01 | 200 |
| 20. | 20770 | ඇලුමිනියම් කළ | 01 | 200 |
| 21. | 21527 | දුණු තරාදි | 01 | 200 |
| 22. | 17489 | දුණු තරාදි | 01 | 200 |
| 23. | 17339 | පොරව | 01 | 200 |
| | | ටෝච් | 01 | 50 |
| 24. | 17266 | සවල් | 01 | 200 |
| | | වේවැල් කූඩ | 01 | 100 |
| 25. | 20035 | ඇලුමිනියම් මුට්ටි | 01 | 200 |
| 26. | 20911 | සවල් | 01 | 200 |
| 27. | 20910 | සවල් | 01 | 200 |
| 28. | 20100 | දුණු තරාදි | 01 | 200 |
| 29. | 21830 | ජංගම දුරකතන | 01 | 500 |
| 30. | 12078 | අලවංගු | 01 | 250 |
| 31. | 18950 | කැති | 01 | 250 |
| 32. | 16673 | ලණු පාර්සල් | 01 | 50 |
| | | විදුලි පංදම් | 01 | 50 |
| | | බාල්දි | 01 | 100 |
| 33. | 9792 | සවල් | 01 | 200 |
| 34. | 22344 | බාල්දි | 01 | 100 |
| | | සවල් | 01 | 200 |
| 35. | 22498 | කළ | 01 | 200 |
| 36. | 15715 | ලීටර් 50 කිරි කෑන් | 01 | 300 |
| | | නයිලෝන් ලණු | 02 | 50 |
| 37. | AR/679/17 | ප්ලාස්ටික් කිරි කෑන් | 03 | 600 |
| 38. | 15485 | කොරහා | 01 | 100 |
| 39. | අංක ගිලිහි ගිය | බැරල් | 40 | 6,000 |
| 40. | අංක ගිලිහි ගිය | හිස් බූලි (තක්සේරු වාර්තා අමුණා ඇත) | 50 | 1,000 |
| 41. | 16623 | ජංගම දුරකතන | 02 | 400 |
| 42. | 22600 | තරාදි | 01 | 1,500 |
| 43. | 13175 | ප්ලාස්ටික් කෑන් | 05 | 750 |
| | | නිකල් කිරි කෑන් | 01 | 500 |

# රජයේ නොවන දැන්වීම්

### සමාගමක් ලියාපදිංචි කිරීම පිළිබඳ ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වන වගන්තිය යටතේ සීමාසහිත පුද්ගලික සමාගමක් ලෙස ලියාපදිංචි කිරීම පිළිබඳ දැනුම් දීමයි.

සමාගමේ නම : වාසල ටුවර්ස් (පීවීටී) එල්ටීඩී
ලියාපදිංචි අංකය : පී වී 00206672
සමාගම ස්ථාපනය කළ දිනය : 2018.11.28
සමාගම ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : 29/3/ඩී, 6 වන පටුමග, මකුලුදූව, පිළියන්දල, ශ්‍රී ලංකාව.
සමාගම් ලේකම් : නීතිඥ කේ. ඒ. එම්. එච්. කොඩිතුවක්කු.

12-431

---

### ජෝන් කීල්ස් ප්‍රොපර්ටීස් (ප්‍රයිවට්) ලිමිටඩ්

(පීවී 1034)

ස්වෙච්ඡාවෙන් ගණන් බේරා වසා දැමීම

2018 නොවැම්බර් මස 03 වැනි දින කොළඹ 02, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවතේ, අංක 117 දරන ස්ථානයේ දී යථා පරිදි රැස් වී පවත්වන ලද ජෝන් කීල්ස් ප්‍රොපර්ටීස් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගමේ සාමාජිකයන්ගේ අති විශෙෂ මහා සභා රැස්වීමේ දී පහත සඳහන් යෝජනා සම්මතය විශේෂ යෝජනා සම්මතයක් වශයෙන් සම්මත කරගන්නා ලදී.

විශේෂ යෝජනා සම්මතය

2017 අංක 07 දරන සමාගම් පනතේ 319 (1) (ආ) වගන්තිය ප්‍රකාරව සමාගම ගණන් බේරා වසා දමන බවට යෝජනා සම්මත කරනු ලැබේ.

සමාගමේ කටයුතු ගණන් බේරා වසා දැමීමේ කාර්යය කොළඹ 02, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවතේ, අංක 117 දරන ස්ථානයේ පිහිටි කීල්ස් කන්සන්ටන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් නියෝජනය කරන නදීජා විජේන්ද්‍රි තම්බයියා, දනූෂා සීනිකා ක්‍රිස්ටිනා පුල්ලේ, රමේෂ් ඇන්තනි පෙරේරා, ෂෙහාරා ගුණසේකර, රාජසූරිය සෝමනාත් ප්‍රනාන්දු, කීර්තනා ක්‍රිෂණකුමාර් සහ එන් අනුෂ්කා කේ. එම්. කුරේ යන මහත්ම මහත්මීන් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් එකඟ වනු ලබන පාරිශ්‍රමිකයක් ගෙවීමට යටත්ව ඈවරකරු වශයෙන් මෙයින් පත්කරන ලබන බවට තවදුරටත් යෝජනා සම්මත කරනු ලැබේ.

කීල්ස් කන්සල්ටන්සි (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු.

කොළඹ 02,
ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවතේ,
අංක 117 දරන ස්ථානයේ දී ය.

12-467

---

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ පහත සඳහන් සමාගම සංස්ථාපනය කළ බවට කරනු ලබන නිවේදනයයි.

සමාගමේ නම : නිව්රෝ ට්‍රාන්සිට් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 00204286
ලියාපදිංචි ලිපිනය : අංක 89/ඒ, ඇඹුල්ගම, හංවැල්ල
සංස්ථාගත කළ දිනය : 2018 සැප්තැම්බර් 15

සමාගමේ අධ්‍යක්ෂක.

12-469

---

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වගන්තිය යටතේ පහත සඳහන් සමාගම සංස්ථාපනය කළ බවට කරනු ලබන නිවේදනයයි.

සමාගමේ නම : ටෙම්පෝ එස්ටේට් ඇග්‍රෝ (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 00204346
ලියාපදිංචි ලිපිනය : පහල කරන්නාගොඩ, වරකාගොඩ
සංස්ථාගත කළ දිනය : 2018 සැප්තැම්බර් 17

සමාගමේ අධ්‍යක්ෂක.

12-470

---

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වගන්තිය යටතේ පහත සඳහන් සමාගම සංස්ථාපනය කළ බවට කරනු ලබන නිවේදනයයි.

සමාගමේ නම : ටෙක්නෝ කොයා එක්ස්පෝට්ස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 00205373
ලියාපදිංචි ලිපිනය : හල්ගොල්ලවත්ත, කෙහෙල්ඇල්ල, බඩල්ගම
සංස්ථාගත කළ දිනය : 2018 ඔක්තෝබර් 16.

සමාගමේ අධ්‍යක්ෂක.

12-471

---

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වගන්තිය යටතේ පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බැව් මින් දන්වමු.

සමාගමේ නම : එම්. බී. කේ. ඉම්පෝට් ඇන්ඩ් එක්ස්පෝට් (පී. වී. ටී.) එල්ටීඩී
ලියාපදිංචි අංකය : පී. වී. 00200743
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 618-1/1 ගාලු පාර, කොළඹ 03.

12-907

---

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වගන්තිය යටතේ පහත සඳහන් සමාගම සංස්ථාපනය කළ බවට කරනු ලබන නිවේදනයයි.

සමාගමේ නම : ඊ ජේ ඇන්ඩ් මාර්ක් එන්ටර්ප්‍රයිසස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 00205547
ලියාපදිංචි ලිපිනය : අංක 22, දියවාල, කිරිඳිවැල
සංස්ථාගත කළ දිනය : 2018 ඔක්තෝබර් 22

සමාගමේ අධ්‍යක්ෂක.

12-472

---

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සීමිත වගකීම් සහිත සමාගම් 2015 අගෝස්තු මස 19 වැනි දින සංස්ථාගත කරන ලද බැව් මෙයින් දන්වා සිටිමු.

සමාගමේ නම : සිටි ස්ටීල්ස් ඇන්ඩ් හාර්ඩ්වෙයාර් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 107826
ලියාපදිංචි කළ දිනය : 2015.08.19
ලියාපදිංචි ලිපිනය : අංක 237/3, හෙලන් මාවත, උල්හිටියාව, (දකුණ) වෙන්නප්පුව.

ජෝසප් සෙක්‍රටේරියල් සර්විසස් (පුද්ගලික) සමාගම,
සමාගමේ ලේකම්වරු.

12-475

---

### සීමිත වගකීම් සමාගමක් සංස්ථාගත කිරීම පිළිබඳ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වගන්තිය ප්‍රකාරව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නම : ටිම්ලෝ සප්ලයි (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ ලියාපදිංචි අංකය : පීවී 00206127
ලියාපදිංචි කාර්යාලය : අංක 34 කේ, හාර්ට්ලන්ඩ්, මිලේනියම් සිටි, අතුරුගිරිය
සංස්ථාගත කළ දිනය : 2018.11.09

සමාගම් ලේකම්වරුන්.

12-490

---

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වගන්තිය යටතේ පහත සඳහන් සමාගම සංස්ථාගත කරනු ලැබේ.

සමාගමේ නම : ඩ්‍රීම් ගයිඩ් ඉන්ටනැෂනල් පුද්ගලික සමාගම
සමාගමේ අංකය : පීවී 115967 - 2016.08.31
ලිපිනය : අංක 44, බස් ස්ටෑන්ඩ් ෂොපින් කම්ප්ලේක්ස්, මීගමුව.

සමාගම් ලේකම්.

12-494

---

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ (9) 2 වගන්තිය ප්‍රකාරව පහත සමාගමේ නම පහත පරිදි වෙනස් කරන ලද බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ පැවති නම : සුමති ග්ලෝබල් කොන්සොලිඩේටඩ් (ප්‍රයිවට්) ලිමිටඩ්
වෙනස්කළ පසු නාමය : සුමති හෝල්ඩිංස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පීවී 216
ලියාපදිංචි කාර්යාලය : අංක 491, ගාලු පාර, කොළඹ 03
ලියාපදිංචි දිනය : 2018.11.19

12-495/1

---

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බවට මෙයින් දන්වමු.

සමාගමේ නම : ඇක්සොන් කැපිටල් රියල්ටි (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී. වී. 00202477
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 7/1/6, බාන්ස් පෙදෙස, කොළඹ 07
ලියාපදිංචි දිනය : 2018.07.26

(ඉහත සඳහන් සමාගමේ ලේකම්වරු)

12-495/2

---

### දැන්වීමයි

වර්ෂ 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම් සංස්ථාපිත කළ බවට මෙයින් දන්වමු.

සමාගමේ නම : රස් ලංකා ඉන්ටර්නැෂනල් එඩියුකේෂන් සෙන්ටර් (පීවීටී) එල්ටීඩී
ලියාපදිංචි අංකය : පී වී 00206223
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 254, යූ. ඊ. පෙරේරා මාවත, රාජගිරිය
ලියාපදිංචි දිනය : 2018.11.12
සමාගමේ නම : ආර්. වයි. බී. එන්. ඉංජිනියරින් (පීවීටී) එල්ටීඩී
ලියාපදිංචි අංකය : පී වී 00206135
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 119/5, පීටර් මාවත, කපුගොඩ
ලියාපදිංචි දිනය : 2018.11.09

ආර්. කේ. එල්. එස්. කෝපරේට් සර්විසස් (පීවීටී) එල්ටීඩී,
(සමාගම් ලේකම්වරු)

12-497

---

### ඇටෝර්නි බලය ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම

නුගේගොඩ, මිරිහාන පාරේ අංක 13/3 හි පදිංචි බ්‍රයන් විනෝද් සෙල්වනායගම් (ජාතික හැඳුනුම්පත් අංක 781060020 V) දරන වන මා වෙත එක්සත් රාජධානියේ 1AE EC3M, ලන්ඩන් ඊසට්චීප්, 8 (FC 1106) (ශ්‍රී ලංකාවේ තම ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය කොළඹ 03, ආර් ඒ ද මෙල් මාවත, අංක 345 හි පිහිටි) චාර්ටඩ් ඉන්ස්ටිටියුට් ෆෝ සෙකුයුරිටීස් ඇන්ඩ් ඉන්වෙස්ට්මන්ට් (සර්විසස්) ලිමිටඩ් විසින් ලන්ඩන් නගරයේ ලුයිස් නීල් හයිඩ්- වාමොන්ඩ් එංගලන්තයේ ප්‍රසිද්ධ නොතාරිස් විසින් 2010.11.09 වැනි දින සහතික කරන ලද රෙජිස්ට්‍රාර් ජෙනරාල් දෙපාර්තමේන්තුවේ ඇටෝර්නි බල සහ ලිඛිත බලධාරිකම් පොතේ 2010.11.18 වැනි දින දරන දින පොත් යොමු අංක 9246 යටතේ පත්‍රිරුව 29 වෙළුම 41 හි ලියාපදිංචි කරන ලද ඇටෝර්නි බලපත්‍රය යටතේ සහ ඒ මගින් පවරණ ලද ඇටෝර්නි බලය මෙයින් අහෝසි කොට ප්‍රත්‍යාදිෂ්ඨ කරන බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලබන අතර, ඇටෝර්නි බලකරු ලෙස මෙම දැන්වීම පළමු දින සිට ඒ සම්බන්ධයෙන් මා විසින් කිසිදු වගකීමක් දරණු නොලැබේ.

බ්‍රයන් විනෝද් සෙල්වනායගම්.

12-499

---

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ පහත සඳහන් සමාගම සංස්ථාගත කරන ලදී.

සමාගමේ නම : ෆෝට් රෙන්ට් අ කාර් (පීවීටී) එල්ටීඩී
සමාගමේ අංකය : පී වී 00205889
ලියාපදිංචි ලිපිනය : 26 මහල, නැගෙනහිර කුලුන, එච්ලන් චතුරශ්‍රය, කොළඹ 01.

12-521

---

### ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

බොරලැස්ගමුව, පාසල් මාවත, අංක 259/1 දරන ස්ථානයේ පදිංචි උඩලමත්ත ගමගේ රොබට් වන මා විසින් බොරලැස්ගමුව, පාසල් මාවත, අංක 259/1, දරන ස්ථානයේ පදිංචි සිරිමෙවන් උඩලමත්ත ගමගේ යන අය වෙත ප්‍රදානය කරන ලද කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එස්. ඒ. එම්. ඒ. සමරනායක විසින් 2012.07.14 වැනි දින සහතික කරන ලද සහ 2012.07.16 වැනි දින ලියාපදිංචි කරන ලද අංක 2303 දරන ඇටෝර්නි බලපත්‍රය වහාම බලපැවැත්වෙන පරිදි මෙයින් ප්‍රත්‍යාදිෂ්ඨ කොට අවලංගු කරන ලද බවත්, එකී සිරිමෙවන් උඩලමත්ත ගමගේ යන අය විසින් කරනු ලබන කිසිදු ක්‍රියාවකට මින් ඉදිරියට මා වග නොකියන බවත්, ඒ හා සම්බන්ධ කිසිදු වගකීමකට නොබැඳෙන බවත්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත් මහජනතාවටත් මෙයින් දැනුම් දෙමි.

උඩලමත්ත ගමගේ රොබට්.

12-541

---

### දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (2) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගමේ නම පහත පරිදි වෙනස් කොට ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ පැරණි නාමය : කේ බී එස් වෙන්චර්ස් (පීවීටී) එල්ටීඩී
ලියාපදිංචි කාර්යාලය : අංක 465, නුවර පාර, කැලණිය
ලියාපදිංචි අංකය : පී වී 101407
සමාගමේ නව නාමය : වැලිතෝන් ලංකා (පීවීටී) එල්ටීඩී

12-543

---

### ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් දුෂ්‍යන්තා පීරිස් සූරියප්පෙරුම විසින් 2006ක් වූ අප්‍රේල් මස 12 වැනි දින සහතික කරන ලද අංක 6732 දරන විශේෂ ඇටර්නි බලපත්‍රය මගින් කිරිඳිවැල, මයිලවලාන පාර, අංක 29 දරන ස්ථානයේ පදිංචි (ජා. හැ. අංක 602281183 V) හිමි කැරගල ආරච්චිගේ සරත් පද්මසිරි ලාල් වන මා විසින් කිරිඳිවැල, මයිලවලාන පාර, අංක 29 දරන ස්ථානයේ පදිංචි (ජා. හැ. අංක. 385690436 V) හිමි පෙදුරුක් අතුකෝරලගේ ගුණවතී යන අය වෙත පවරාදෙන ලද ඇටර්නි බලතල මෙයින් සම්පූර්ණයෙන් අවලංගු කරන ලද බව සියලු දෙනා වෙත මෙයින් දන්වා සිටිමි.

තවද, එකී පෙදුරුක් අතුකෝරලගේ ගුණවතී විසින් එකී ඇටර්නි බලපත්‍රය මත සිදු කරනු ලබන කිසිදු ක්‍රියාවකට හෝ ගනුදෙනුවකට මෙයින් පසු මා විසින් වගකීමක් නොදරන බවට මෙයින් ප්‍රකාශකර සිටිමි.

කැරගල ආරච්චිගේ සරත් පද්මසිරි ලාල්.

12-545

---

### ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 7 දරන නව සමාගම් පනත ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාපනය කළ බවට කරනු ලබන නිවේදනයයි.

සමාගමේ නම : ඔලීකො සොලුෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම ලියාපදිංචි අංකය : පී වී 128326
ලියාපදිංචි ලිපිනය : අංක 210, මිරිස්වත්ත, බෙන්තොට.

12-546

---

### නිවේදනයයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ පහත සඳහන් සීමාසහිත පුද්ගලික සමාගම සංස්ථාපනය කළ බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නම : මෙඩිඩෙක්ස් (පීවීටී) එල්ටීඩී
ලියාපදිංචි අංකය : පී වී 00204409
ලියාපදිංචි දිනය : 2018.09.18
ලියාපදිංචි කාර්යාලය : අංක 70/එච්, ශ්‍රී සිද්ධාර්ථ මාවත, කිරුළපන, කොළඹ 05.

සමාගම් ලේකම්.

12-591

---

### නිවේදනයයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ පහත සඳහන් සමාගම සංස්ථාගත කරන ලදී.

සමාගමේ නම : ලක්ෂරි පර්පල් ලංකා (පීවීටී) එල්ටීඩී
සමාගමේ අංකය : පී වී 00204532
සමාගමේ ලියාපදිංචි කාර්යාලය : MUNUCIPAL COMPLEX, BUILDING, SHOP NO. 1, FUSSELS LANE, GALLE ROAD, COLOMBO 06.
සංස්ථාගත කිරීමේ දිනය : 2018.09.21

ලියාපදිංචි ලේකම්වරු.

12-595

---

### නිවේදනයයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ පහත සඳහන් සමාගම සංස්ථාගත කරන ලදී.

සමාගමේ නම : ෆිනෙස් ෆර්නිචර් ඇන්ඩ් ඉන්ටිරියර් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 98055
සමාගමේ ලියාපදිංචි කාර්යාලය : අංක 25/4, කටුකුරුන්ද පාර, මොරටුව
සංස්ථාගත කිරීමේ දිනය : 2014 අප්‍රේල් මස 07 වැනි දින.

ලියාපදිංචි ලේකම්වරු.

12-596

### ප්‍රසිද්ධ දැන්වීමයි

ඉන්ටර්නැෂනල් ප්‍රිසිෂන් මෝල්ඩ්ස් ඇන්ඩ් ටූල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් (පීවී 10847) සහ අයි පී එම් ටී ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් (පීවී 85148) ඒකාබද්ධ කිරීම

පීවී 10847 යටතේ ලියාපදිංචි කරන ලද ඉන්ටර්නැෂනල් ප්‍රිසිෂන් මෝල්ඩ්ස් ඇන්ඩ් ටූල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් සහ පීවී 85148 යටතේ ලියාපදිංචි කරන ලද අයි පී එම් ටී ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් යන ආයතනයන් 2007 අංක 07 දරන සමාගම් පනතේ විධිවිධාන වලට අනුකූලව සහ සමාගම් ඒකාබද්ධ කිරීමේ සහතිකය ලබා ගැනීමෙන් අනතුරුව 2018.10.01 දින සිට එක් සමාගමක් බවට ඒකාබද්ධ කරන ලද බව එකී පනතේ 244 (3) වගන්තිය ප්‍රකාරව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒකාබද්ධ කරන ලද සමාගමේ නාමය ඉන්ටර්නැෂනල් ප්‍රිසිෂන් මෝල්ඩ්ස් ඇන්ඩ් ටූල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් වන අතර එහි ලියාපදිංචි කාර්යාලය අංක 583/46, බ්ලූ ඩයමන්ඩ් පාර, ලියනගේමුල්ල, සීදූව ලිපිනයෙහි වේ.

ඩී. ඊ. එම්. වාසලතන්ත්‍රි,
සමාගම් ලේකම්වරු.

ප්ලාසා කම්ප්ලෙක්ස්, ඒකක අංක 18-U/F (A) 1b,
IPZ කටුනායක,
2018 නොවැම්බර් මස 26 වැනි දින දී ය.

12-607

---

### දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) දරන වගන්තිය යටතේ, පහත නම සඳහන් සමාගම සංස්ථාගත කරන ලදී.

සමාගමේ නම : සිල්වර්ඩේල් සර්විසස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පීවී 00204556
සංස්ථාගත කළ දිනය : 2018.09.22
ලිපිනය : ප්ලොට් අංක ඒ, 47/42 ඒ, පෙරේරා මාවත,
තලංගම.

කොම්සෙකි (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු.

12-612

---

### දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) දරන වගන්තිය යටතේ, පහත නම සඳහන් සමාගම සංස්ථාගත කරන ලදී.

සමාගමේ නම : එතිකල් ටීස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පීවී 00205210
සංස්ථාගත කළ දිනය : 2018.10.11
ලිපිනය : අංක 333/බී, වැකඩ පාර, උඩුපිල, දෙල්ගොඩ.

කොම්සෙකි (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු.

12-613

---

### දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) දරන වගන්තිය යටතේ, පහත නම සඳහන් සමාගම සංස්ථාගත කරන ලදී.

සමාගමේ නම : මෙට්රෝ ලංකා ඉලෙක්ට්‍රික් වෙහිකල්
ටෙක්නොලොජි (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පීවී 00203792
සංස්ථාගත කළ දිනය : 2018.09.04
ලිපිනය : අංක 16, පළමු මහල, ජනජයසිටි සාප්පු සංකීර්ණය,
ශ්‍රී ජයවර්ධනපුර මාවත, රාජගිරිය.

කොම්සෙකි (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු.

12-614

---

### දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) දරන වගන්තිය යටතේ, පහත නම සඳහන් සමාගම සංස්ථාගත කරන ලදී.

සමාගමේ නම : එස්. එස්. කාර් කෙයාර් (පීවීටී) එල්ටීඩී
සමාගමේ අංකය : පීවී 00204382
සංස්ථාගත කළ දිනය : 2018.09.18
ලිපිනය : අංක 162 බී, ප්‍රධාන පාර, අත්තිඩිය, දෙහිවල.

කොම්සෙකි (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු.

12-615

---

### ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ, පහත සඳහන් සමාගම සංස්ථාගත කරන ලදී.

සමාගමේ නම : බ්ලැන්ක්ටෙක් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 00205924
ලියාපදිංචි කළ දිනය : 2018 නොවැම්බර් මස 02 වැනි දින
ලියාපදිංචි කාර්යාලය : අංක 97ඒ, ගාළු පාර, කොළඹ 03.

අධ්‍යක්ෂ.

12-651/1

---

### ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය අනුව මෙයින් දන්වා සිටින වගනම්,

සමාගමේ නම : රැපිස්කන් සිස්ටම්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 00206707
ලියාපදිංචි කළ දිනය : 2018 නොවැම්බර් මස 29 වැනි දින
ලියාපදිංචි කාර්යාලය : අංක 97A, ගාලු පාර, කොළඹ 03.

අධ්‍යක්ෂක.

12-651/2

---

### නිවේදනයයි

2007 අංක 7 දරන සමාගම් පනතේ (9) 1 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාගත කොට ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නම : ක්ලියෝ ඇක්සසරිස් (පී වී ටී) එල් ටී ඩී
සමාගමේ අංකය : පීවී 00200377
ලියාපදිංචි කාර්යාලය : අංක 52, සර් මාර්කස් ප්‍රනාන්දු මාවත,
කොළඹ 07
ලියාපදිංචි දිනය : 2018.10.23

වෝටර්ස් සෙක්රෙටේරියල් සර්විසස් (පී වී ටී) එල්ටීඩී.

12-654

---

### ප්‍රසිද්ධ දැනුම්දීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ, පහත සඳහන් සමාගම සංස්ථාගත කරන ලදී.

සමාගමේ නම : සියෝන් සොෆ්ට් බිස්නස් සොලූෂන්ස් (ප්‍රයිවට්)
ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 00206507
ලියාපදිංචි කළ දිනය : 2018 නොවැම්බර් මස 21 වැනි දින
ලියාපදිංචි ලිපිනය : අංක 20, තලවතුගොඩ පාර, පිටකෝට්ටේ.

සමාගම් ලේකම්.

12-659

---

### ඇටෝර්නි බලය අවලංගු කිරීම

පිටකෝට්ටේ, පාගොඩ පාරේ, ආනන්ද බාලිකා මාවතේ, අංක 12/7 දරන ස්ථානයේ පදිංචි සඳසිරි ගුණරත් අර්ථනායක වන මා විසින් රාජගිරිය, නාවල, ගල්පොත්ත පාරේ, අංක 54/14 හි පදිංචි ප්‍රසාද් ගුණරත් අර්ථනායක වෙත ප්‍රදානය කරන ලද, ජපානයේ ටෝකියෝ හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ සමාදාන විනිශ්චයකාර චාමරි රොඩ්‍රිගෝ විසින් 2008.05.02 වැනි දින සහතික කරන ලද ඇටෝර්නි බලපත්‍රය මෙහි දින සිට අවලංගු වී අහෝසි වන අතර, එය බලපැවැත්වීමක් නොවන බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙත සහ මහජනතාව වෙත මෙයින් දන්වා සිටිමි.

සඳසිරි ගුණරත් අර්ථනායක.

2018 දෙසැම්බර් මස 05 වැනි දින,
12/7, ආනන්ද බාලිකා මාවත, පාගොඩ පාර,
පිටකෝට්ටේ.

12-662

---

### දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව ෆැග්සා (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම 2018 නොවැම්බර් මස 26 වැනි දින සංස්ථාපනය කරන ලදී.

සමාගමේ නම : ෆැග්සා (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 00206596
ලියාපදිංචි ලිපිනය : අංක 23, පළවන පටුමග, කිරුළපන, කොළඹ 05.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියෝග ප්‍රකාරව,
අධ්‍යක්ෂ,
සිලෝන් සෙක්‍රටේරියල් සර්විසර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු,
ෆැග්සා (ප්‍රයිවට්) ලිමිටඩ්.

12-665

---

### ඇටෝර්නි බලය අවලංගු කිරීම

රණාල, ජල්තර, අංක 247/23 දරන ස්ථානයේ පදිංචි එගොඩහේවගේ ශ්‍රියාණි (ජා. හැ. අංක 706291563 V) පන්නිපිටිය ඇරැව්වල පාර, අංක 269/6 දරන ස්ථානයේ පදිංචි එගොඩහේවගේ උපාලි (ජා. හැ. අංක 681862846 V) රණාල, ජල්තර අංක 247/23 දරන ස්ථානයේ පදිංචි එගොඩහේවගේ කුසලානි (ජා. හැ. අංක 666031156 V) වන අප රණාල, ජල්තර, අංක 247/23 දරන ස්ථානයේ පදිංචි එගොඩහේවගේ ඉන්ද්‍රානි යන අයට ප්‍රසිද්ධ නොතාරිස් බී. ටී. එන්. පෙරේරා මහතා ලියා සහතික කළ අංක 60 සහ 2008.01.13 දිනැති ඇටර්නි බලපත්‍රය මගින් අප වෙනුවෙන් ක්‍රියාකිරීමට දී තිබූ ඇටර්නි බලය 2018.12.04 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි අවලංගු කරන අතර එදිනට පසුව ඇය විසින් සිදුකරනු ලබන කිසිදු ක්‍රියාවකට අප විසින් වග නොකියන බවත් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත් එහි මහජනතාවටත් මෙයින් දැනුම් දෙමු.

එගොඩහේවගේ ශ්‍රියාණි,
එගොඩහේවගේ උපාලි,
එගොඩහේවගේ කුසලානි.

12-746

---

### ඇටෝර්නි බලය අවලංගු කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පන්නල තැපැල් පහළ ගලයාය පදිංචි හිටිහාමි අප්පුහාමිලාගේ මහේෂ් ශිරන්ත (ජා. හැ. අ. 862430646 වී) වන මම මාගේ නීත්‍යානුකූල ඇටෝර්නි බලකරු ලෙස පන්නල තැපැල් පහළ ගලයාය පදිංචි ජයමහ හිටිහාමිලාගේ ඥනලතා (ජා. හැ. අ. 537671777 වී) පත්කරමින් ලියන ලද පන්නල ප්‍රසිද්ධ නොතාරිස් ගාමිණී විජේවර්ධන මහතාගේ අංක 16 හා 2014.08.20 වැනි දින දරන ඇටෝර්නි බලපත්‍රය අවලංගු කර ප්‍රත්‍යාදිෂ්ඨ කරන බව උතුම් වූ ශ්‍රී ලංකා ජනරජයටත් මහජනතාවටත් මෙයින් දැනුම් දෙමි.

එච්. ඒ. මහේෂ් ශිරන්ත.

12-920

---

**කිසියම් හේතුවක් නිසා ගැසට් නිවේදනයක් අවලංගු කරන්නේනම් ඒ බව එම සතියේ සඳුදා දිනට පෙර දැනුම් දිය යුතුය.**

I කොටස : I ඡෙදය යටතේ පළවන දැන්වීම් සහ I කොටස : (IIආ) ඡෙදයේ වෙන්දේසි කිරීම් යටතේ පළවන ඉතිරි සියලු දැන්වීම් 2018.12.21 දින ගැසට් පත්‍රයේ පළවේ.

මුද්‍රණය හා බෙදාහැරීම ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසිනි.
www.documents.gov.lk